# නියමුවා

"කාන්තාවට නිවසේ කිරීමට ඇති වැඩ හේතුකොටගෙන ඇය තවමත් දුෂ්කර තත්වයක පසුවෙයි. ඇයට සම්පූර්ණ විමුක්තිය ලබාදීමට සහ ඇය පුරුෂයා හා සම තත්වයට ගෙන ඒම ක්‍රියාත්මක කිරීමට ජාතික ආර්ථිකය සමාජවාදීකරණය කිරීමත් කාන්තාවන් පොදු ඵලදායී ශ්‍රමයේ නිරත කරවීමත් අවශ්‍ය වේ. එවිට කාන්තාවන් පුරුෂයින්ගේ තත්වයම දරනු ඇත."

ලෙනින්

කාන්තා විමුක්තිය ගැන,
93 පිටුව

ISSN 1391 - 1031 | 2024 ජනවාරි 28 වෙළුම | 05 කලාපය | ජනතා විමුක්ති පෙරමුණේ මධ්‍යම පුවත්පත | පුවත්පතක් වශයෙන් ශ්‍රී ලංකාවේ ලියාපදිංචි කරන ලදී | ආධාරය රු 100/=



NPP කාන්තා සමුළුව මාතර දිස්ත්‍රික්කය - 2023.12.30

# නව පුනරුද යුගයක් කරා රට ගෙනයමු!

කඩා වැටුණු රාජ්‍යය ගොඩනගන, සුණු විසුණු කර තිබෙන සමාජය ඒකාග්‍රතාවයකට ගෙනෙන, පොදු ජනයා අතට යුක්තිය සාධාරණය ගලා එන නව සමාජ ක්‍රමයක් අවදි කළ යුතුව ඇති බවත් ඒ සඳහා සිංහල, දෙමළ, මුස්ලිම් ජාතික ඒකාග්‍රතාවය ගොඩනැගිය යුතුව ඇති බවත් එය ගොඩනැගිය යුත්තේ බලය ලබා ගැනීම සඳහා පමණක් නොව රට ගොඩනැගීම සඳහා බවත් එසේ නොමැතිව මාතෘ භූමියත් එහි වෙසෙන ජනයාත් පවතින බේදනීය තත්වයෙන් ගොඩගත නොහැකි බවත් අවධාරණය කළ ජාතික ජන බලවේගය, කඳුළු, සෝ සුසුම් හෙළමින් තිබෙන මාතෘ භූමියටත් එහි වෙසෙන ජනයාටත් නිදහස් ජීවිතයක් ලබාදෙන නව ජාතික ව්‍යාපාරයක් ඔස්සේ නව පුනරුද යුගයක් කරා රට ගෙනයමු යැයි ආරාධනා කළේය.

පසුගිය 30වැනි දින මාතර දිස්ත්‍රික් කාන්තා සමුළුවේදී ජාතික ජන බලවේගය වෙනුවෙන් අදහස් දක්වමින් නායක අනුර කුමාර දිසානායක සහෝදරයා මේ බව ප්‍රකාශ කළේය.

"දේශපාලන බලය අත්පත් කර ගැනීම ආරම්භය පමණයි. ඉන්පසුව වෙහෙස නොබලා වැඩකරන ඕනෑම කැපකිරීමක් කළ හැකි ජාතික ව්‍යාපාරයක් ගොඩනගමු. ඒ වෙනුවෙන් මාතරින් ඉතාම ධෛර්යවන්ත, යෝධ පියවරක තබා තිබෙනවා. අපි සියලු දෙනා නොනැවතී ඉදිරියට යමු." ඔහු රැස්ව සිටි අති විශාල ජනකාය අමතමින් ඉල්ලා සිටියේය. මෙහෙදී වැඩිදුරටත් කරුණු දැක්වූ අනුර දිසානායක සහෝදරයා මෙසේද පැවසීය.

"ඉන්දියාවේ බ්‍රිතාන්‍ය අධිරාජ්‍යවාදීන්ට එරෙහිව දැවැන්ත ජාතික ව්‍යාපාරයක් තිබුණා. නේරු, ගාන්ධි, චන්ද්‍රබෝස්, පාතෙල්, ඇති කළ ජාතික ව්‍යාපාරයේ පිබිදීම නිසා අද ඉන්දියාව සඳ තරණය කරන මට්ටමට පැමිණ සිටිනවා. දෙවන ලෝක යුද්ධයේදී ඇමෙරිකානු පරමාණු බෝම්බ හෙළීමෙන් සමතලා වුණු ජපානය අධිෂ්ඨානයෙන් නැවත නැගී සිටියා. චීනය, වියට්නාමය වගේ රටවල් ගත්තත් නව ලෝකයේ තාක්ෂණික ජයග්‍රහණයන් යොදාගෙන ආර්ථික, බලවතුන් වී සිටිනවා. එක්සත් ජනපදය බ්‍රිතාන්‍ය ආධිපත්‍යයට එරෙහිව ගෙන ආ ජාතික පිබිදීම තුළින් මූලාරම්භය ගත්තා. අපිට එහෙම ජාතික පිබිදීමක් තිබුණේ නැහැ. තාමත් කතා කරන්න තිබෙන්නේ 1818, 1848 නැගී සිටින් මුතුන් මිත්තන් ගැන. 1848 සිට 1948 දක්වා කතා කරන්න මුතුන්මිත්තන් අපිට නැහැ. ඉන්දියාවේ ගාන්ධිලා, නේරුලා, පාතෙල්ලා බිහිවන විට අපිට හැදුණේ ස්ටීවන්ලා, ජූනියස් රිචඩ්ලා, රිජ්වේලා, සොලමන් ඩයස්ලා වගේ අය. ජාතිය අවදි කරන සටනක් අපට තිබුණේ නැහැ. ජාතික හැඟීමකින් රට නැගිට්ටවනවා වෙනුවට සිංහලයාට විරුද්ධව දෙමළාත්, දෙමළාට විරුද්ධව මුස්ලිම් කෙනාත් නැගිට්ටවන දේශපාලන සංස්කෘතියක් බිහිකර මහා බේදවාචකවලින් කෙළවර වුණා.

තමන්ගේ ජීවිතයේ අත්පත කර ගත යුතු අවම වුවමනාවන් වත් ඉටුකර ගත නොහැකි වු ගැහැනියක් හැටියට මිය යාමට සලසා තිබෙන ක්‍රමය අපි වෙනස් කරන්න ඕනෑ. රූපවාහිනී නාලිකාවල උදේ හතහමාරෙන් පස්සේ සාස්තර කියන අය ගෙන්වා ගන්නවා. මිථ්‍ය මතවලින් කාන්තාවන් රවටන්න විවිධ වැඩසටහන් උපයෝගී කර ගන්නවා. සමහර සාස්තරකාරයෝ රූපවාහිනි නාලිකාවලට ගෙවීමක් කර, කාලය ලබා ගන්නවා. ඉන්පසු ප්‍රචාරය කරන වෙළඳ වැඩසටහන් පවා එහෙමයි. හැබැයි ජාතික ජන බලවේගය අද ගැහැනුන්ගේ ශක්තිමත් කර තිබෙන්නේ එවැනි විෂබීජවලට හැරවිය නොහැකි ආකාරයටයි. දේශපාලනය වෙනස් කිරීමෙන් තොරව බේදවාචකයන්ගෙන් මිදී ජීවත්වීම ආරම්භ කරන්න බැහැ. ඒවගේම දේශපාලනයෙන් පමණක් මේ වෙනස් සිදුකරන්න බැහැ. මේ කඩා වැටුණු ආර්ථිකය ප්‍රකෘතිමත්භාවයට පත්කරන්න බිඳ වැටුණු සමාජය කාන්තාවන් ලෙස තමන්ගේ මව, සොහොයුරිය වශයෙන් බලන සමාජයක් ගොඩ නැගිය යුතුයි. ගැහැනිය තවදුරටත් කෙළිබඩුවක් වෙනවා වෙනුවට යුක්තිය, සාධාරණත්වය, සමානත්වය පදනම් කර ගත් ආධ්‍යාත්මයට යළි පණ දිය යුතුයි. ඒ සියල්ල කළ හැකි වන්නේ දේශපාලන පරිවර්තනයකින් ආරම්භය ගැනීමෙන් පමණයි. නව පුනරුද ව්‍යාපාරයක් නව ජාතික ව්‍යාපාරයක් ඔස්සේ දැවැන්ත සමාජ පරිවර්තනයක් සිදුකළ යුතුයි. ජාතික ජන බලවේගයේ ගැහැනු ව්‍යාපාරය කියන්නේ මේ රට පුනරුදය කරා ගෙනයන ප්‍රධානම බලවේගය වන පංගුකාරියන්ගේ සංවිධානයයි.

රනිල් වික්‍රමසිංහ අර්බුදය තේරුම් ගත්තේ ඩොලරය ඉහළ පහළ යාමෙන්, අයවැය හිඟය අඩුවැඩි වීමෙන්, වියදමට භාණ්ඩාගාරයේ මුදල් තිබෙනවාද නැද්ද කියන කාරණය අනුවයි. රනිල් වික්‍රමසිංහ ඇතුළු නඩයට අර්බුදය පෙනෙන්නේ ගිණුම්වලින් සහ **10 වැනි පිටුවට**

## 03 රටට නව දේශපාලන...

රටට නව දේශපාලන පරිවර්තනයක් අවශ්‍යයි. ජාතික ජන බලවේගය මෙම මැතිවරණවලට තරග වදින්නේ අන්න ඒ ජාතික ඒකාග්‍රතා සහිත නව පන්නයේ ජාතික නිදහස් අරගලයක ස්වරූපයෙන් සහ මැදිහත්වීමෙන්...



## 05 ජනාධිපතිවරණයද?...

එක්කෝ ජනාධිපතිවරයා පාර්ලිමේන්තුව විසුරුවා හළ යුතු අතර, නැති නම් පාර්ලිමේන්තුවේ යෝජනාවක් සම්මත කොට එය ජනාධිපතිවරයාට දැන්විය යුතුය. එබැවින් ජනාධිපතිවරණය සඳහා අලුත් තීරණයක් ගැනීමට...



## 09 තත්වයන් අබිබැවූ...

මිනිසා භාෂාව සොයා ගන්නටත් පෙර සිටම, මිනිසා හා තදින් බැඳුනු වචන දෙකක් ඇත. ඒවා වචන ලෙස හඳුන්වනු ලබන්නේ වුවද, ඇත්ත වශයන්ම ඒවා තත්වයන් ලෙස පෙන්වා දිය හැකිය. එනම් අභියෝග හා බාධකයන්ය. අභියෝග සාමාන්‍ය ජීවිතයේ එදිනෙදා හමුවන...




තරුණ .................. 04
ජාත්‍යන්තර .................. 06
ආර්ථිකය .................. 07
කාන්තා .................. 08
විශේෂාංග .................. 10
වේදිකාව .................. 11


*යුක්තිගරුක දේශයක්! සාධාරණ සමාජයක්!! නිවහල් මිනිසෙක්!!!*

# සටන් බිම

## දෙසැම්බර් 12 රට පුරා රාජ්‍ය සේවක විරෝධතා



සියලු සේවකයින්ට රු. 20,000 ක දීමනාවක් දිනා ගැනීම, රු. 20,000න් 10,000ක මුදලක් ජනවාරි වැටුපට දිනා ගැනීම, රාජ්‍ය සේවක වැටුපෙන් 8%ක් කපා ගැනීමේ ආණ්ඩුවේ යෝජනාව පරාජය කිරීම, 2016 සිට අහිමි කර ඇති පූර්ණ විශ්‍රාම වැටුප් හිමිකම යළි දිනා ගැනීම යන මූලික කරුණු මුල්කරගෙන පසුගිය දෙසැ. 12 දින රට පුරා රාජ්‍ය හා පළාත් රාජ්‍ය සේවා වෘත්තීය සමිති විසින් එක්දින අසනීප නිවාඩු වාර්තා කිරීමේ ක්‍රියාමාර්ගයක් දියත් කළ අතර ඒ සඳහා වෘත්තීය සමිති ගණනාවක් එක් වී සිටියහ. මේ සඳහා සංවර්ධන නිලධාරීන්, ග්‍රාම නිලධාරීන්, සමෘද්ධි නිලධාරීන් ඇතුළුව ගුරු-විදුහල්පතිවරු, සෞඛ්‍ය ක්ෂේත්‍රය, මුද්‍රණ සේවාව ආදී ක්ෂේත්‍ර නියෝජනය කරමින් එම ක්ෂේත්‍රවල වෘත්තීය සමිති මෙම විරෝධතාවය සඳහා සහාය ලබාදෙමින් එක්වී සිටියහ.

එදින මෙම විරෝධතා ක්‍රියාමාර්ගයට සමගාමීව රටපුරා උද්ඝෝෂණ ව්‍යාපාර දියත් වූ අතර කොළඹ සෙත්සිරිපාය ඉදිරිපිටදීද විරෝධතා උද්ඝෝෂණයක් පැවැත්විණි. මේ සඳහා රාජ්‍ය හා පළාත් රාජ්‍ය සේවා වෘත්තීය සමිති එකමුතුව වෙනුවෙන් චන්දන සූරියආරච්චි, උදේනි දිසානායක, මහින්ද ජයසිංහ, චන්දිම විමලසුරේන්ද්‍ර, චාමර මද්දුමකළුගේ ඇතුලු වෘත්තීය සමිති නියෝජිතයෝ සහභාගි වූහ.

## ගුරු විදුහල්පතිවරු පාර්ලිමේන්තු වටරවුමේ විරෝධතාවක



මෙවර අයවැය පුස්සක්, වැටුප් විෂමතාවයේ ඉතිරි 2/3 ලබාදෙනු, රු. 20000 ක ජීවන වියදම් දීමනාවක් ගෙවනු, පාසල් නඩත්තු කිරීමේ බර දෙමව්පියන්ගෙන් ඉවත් කරනු, අධ්‍යාපනයට 6%ක් වෙන්කරනු, අධ්‍යාපනය විකිණීම නවතනු යන ප්‍රධාන කරුණු මුල්කරගනිමින් ගුරු-විදුහල්පති වෘත්තීය සමිති සන්ධානය මගින් පසුගියදා බත්තරමුල්ල පාර්ලිමේන්තු වටරවුමේදී විරෝධතා උද්ඝෝෂණයක් පැවැත්වූ අතර මේ සඳහා පොලිසියෙන් විවිධ බාධා කිරීම් සිදුවිය. ගුරු විදුහල්පති වෘත්තීය සමිති සන්ධානය වෙනුවෙන් මහින්ද ජයසිංහ, ජෝසප් ස්ටාලින් ඇතුළු වෘත්තීය සමිති නියෝජිතයෝ විශාල පිරිසක් මේ සඳහා සහභාගි වූහ.

## අයවැයෙන් සහන නැහැ වෙළඳ කලාප සේවකයෝ විරෝධතාවල



අයවැයෙන් වෙළඳ කලාප සේවකයින් සඳහා කිසිවක් ලබා නොදීමට එරෙහිව විරෝධතා ආරම්භ කළ බව වෙළඳ කලාප සේවකයින්ගේ ජාතික මධ්‍යස්ථානය පවසයි. විශේෂයෙන් බදු ගැසීම මගින් පෞද්ගලික අංශයේ සේවකයින් පීඩාවට පත් කිරීම හා ජීවන බර ඉහළ යාම හමුවේ ජීවිතය කඩා වැට්ටවීමට එරෙහිව මෙම විරෝධතා අරඹා ඇත. ඒ අනුව පසුගියදා කටුනායකදී මෙම විරෝධතා ක්‍රියාමාර්ග ආරම්භ කළ අතර ඒ සඳහා වෙළඳ කලාප සේවකයින්ගේ ජාතික මධ්‍යස්ථානයේ කැඳවුම්කරු ගාමිණී රත්නායක හා එම මධ්‍යස්ථානයේ කටුනායක කලාප සංවිධායක චින්තක ප්‍රදීප් ඇතුළු කටුනායක වෙළඳ කලාපය නියෝජනය කරමින් සේවකයෝ එක් වී සිටියහ.

මෙහිදී ගාමිණී රත්නායක සහෝදරයා සඳහන් කර සිටියේ රටට වැඩි වශයෙන්ම ඩොලර් ගෙනෙන වෙළඳ කලාප සේවකයා කබලෙන් ලිපට වැටී ඇති බවත් ආණ්ඩුව තවදුරටත් වෙළඳ කලාප සේවකයින් නොසලකා හරින්නේ නම් සියලුම කලාප සේවකයින් සමග එක්ව ඒකාබද්ධ ක්‍රියාමාර්ගවලට යෑමට කටයුතු කරන බවත්ය.

## හිටපු සෞඛ්‍ය ඇමති වහා අත්අඩංගුවට ගත යුතුයි

### වෛද්‍ය ජයන්ත බණ්ඩාර



සෞඛ්‍ය අමාත්‍යාංශය තුළ මහත් අන්දෝලනයට තුඩු දී ඇති ඖෂධ ජාවාරම පිළිබඳව චෝදනා එල්ල වී ඇති හිටපු ඇමති කෙහෙළිය රඹුක්වැල්ල වහා අත්අඩංගුවට ගත යුතු බව සමස්ත ලංකා වෛද්‍ය නිලධාරී සංගමයේ ලේකම් වෛද්‍ය ජයන්ත බණ්ඩාර සහෝදරයා පවසයි. මේ සම්බන්ධයෙන් පසුග යදා පැවැත්වූ මාධ්‍ය හමුවකදී ඔහු මේ බව පැවසීය.

දැනට අත්අඩංගුවේ සිටින සෞඛ්‍ය ලේකම් සහ අදාළ භූත සමාගමේ අධ්‍යක්ෂවරයා ප්‍රකාශ කර ඇත්තේ ඇමති වරයාගේ උපදෙස් අනුව තමන් ක්‍රියා කළ බවය. ඒ අනුව මේ භූත සමාගමේ සැබෑ හිමිකරු කෙහෙලිය රඹුක්වැල්ල විය යුතු බවට බරපතළ සැකයක් මතු වී ඇති බව වෛද්‍ය ජයන්ත බණ්ඩාර සහෝදරයා මෙහිදී පැවසීය. ඇමතිවරයා සැකපිට අත්අඩංගුවට ගැනීමට කරුණු ඉදිරිපත් වී තිබියෙදී ඔහු තවමත් නිදැල්ලේ සිටීම සැකයට තුඩු දෙන කාරණයක් බව පෙන්වා දුන් ඔහු, මෙම ව්‍යාජ ඖෂධ ලබාදෙමින් සිදුකළ අපරාධයෙන් අසාධාරණයට ලක්වූ දහස් ගණනක් රෝගීන්ට සාධාරණය ඉටුකළ යුතු බව අවධාරණය කළේය.

## ජාතික ජන බලවේගයේ නීතිඥයෝ සංවිධානයේ මාධ්‍ය හමුව 2023.12.05



## කාන්තා උද්ඝෝෂණයට ජල ප්‍රහාර එල්ල කිරීම ආණ්ඩුවේ බියගුළු ක්‍රියාවක්

### නීතිඥ ධනුෂ්කි ලියනපටබැඳි

පසුගිය 04 වැනිදා ළමා හා කාන්තා කටයුතු අමාත්‍යාංශයේ අයවැය විවාදය පැවැත්වූවා. ලබන වසර වෙනුවෙන් එම අමාත්‍යාංශයට වෙන්කර තිබෙන මුදල් මෙම වසරට වඩා 51%න් කපා හැරීමට එරෙහිව ජාතික ජන බලවේගයේ කාන්තාවෝ බත්තරමුල්ල, දියත උයන ඉදිරිපිටදී උද්ඝෝෂණයක් පැවැත්වූවා. ඒ, ජනතාවට ජීවන බර උසුලා ගන්න බැරිම තත්වයට පත්කිරීම නිසා, රටේ සමස්ත කාන්තාවන් සහ දරුවන් වෙනුවෙන් අපි ඊයේ පාරට බැස්සේ. දැඩි විරෝධයක් මේ කාන්තාවන් පළ කළත් කිසිම ආකාරයකින් සාමකාමී තත්වයට බාධා සිදුකළේ නැහැ. උද්ඝෝෂණයෙන් පසුව කාන්තාවන් විසිරී යාමට ආසන්න වෙලාවේ තමයි ප්‍රහාරය එල්ල කළේ. අපි මේ ප්‍රහාරය දකින්නේ අවසන් සුසුම් හෙළමින් සිටින ආණ්ඩුවේ බියගුළු ප්‍රහාරයක් හැටියටයි. තව දින 05කින් මානව අයිතිවාසිකම් පිළිබඳ විශ්ව ප්‍රඥප්තිය අත්සන් කර, අවුරුදු 75ක් සම්පූර්ණ වෙනවා. රටක් හැටියට ලංකාවේ රජයක් තවත් රටවල රැසක් සමග මේ ගිවිසුමට අත්සන් තබා තිබෙනවා. අපේ රටේ ජනතාවට මනුෂ්‍යයින් හැටියට අභිමානයෙන් ජීවත් වීමේ ගරුත්වය අහිමි කළ මේ ආණ්ඩුව මානව අයිතිවාසිකම් පිළිබඳ විශ්ව ප්‍රඥප්තියේ වගන්ති සහමුලින්ම උල්ලංඝනය කර තිබෙනවා. ජනතාවගේ ප්‍රශ්න වෙනුවෙන් කතා කිරීම වගේම කාන්තාවන් වෙනුවෙන් කතා කිරීමට විශේෂ වෘත්තීමය අයිතියක් නීතිඥවරුන් වශයෙන් අපට තිබෙනවා.

## දරුවන්ගේ සෞඛ්‍යය, අධ්‍යාපනය කඩා වැටීම බලා ඉන්න බැහැ

### නීතිඥ දිස්නි සමන්තිකා ලියනආරච්චි

ලංකාවේ ජනගහනයෙන් 52%ක් කාන්තාවන්. පසුගිය වසරේ දූෂිත පාලනයට එරෙහිව ජන අරගලයේ ප්‍රධාන කොටසක් ඉටුකළේ කාන්තාවන්. පවතින දූෂිත පාලන ක්‍රමය කාන්තාවන්ට එල්ල කරන පීඩනය වෙනස් කිරීමට සාමකාමී උද්ඝෝෂණයක යෙදී සිටි කාන්තාවන්ට නින්දා සහගත ජල ප්‍රහාරයක් එල්ල කළා. තමන්ට තිබෙන ගැටලු සම්බන්ධයෙන් කාන්තාවන් පාරට බැස්ස අවස්ථාවක් ඒක. ළමුන් හා කාන්තාවන්ගේ ආරක්ෂාව සම්බන්ධයෙන් උපරිම නීති සහ අණපනත් පනවා තිබෙනවා. එසේ තිබියදීත් එල්ල කළ මේ ප්‍රහාරය කාන්තාවන් සහ නීතිඥවරියන් හැටියට දැඩි ලෙස හෙළා දකිනවා. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ මූලික අයිතිවාසිකම්වලින් තහවුරු කර තිබෙන අයිතියක් පාවිච්චි කිරීමේදී අශිෂ්ටසම්පන්න ලෙස පහරදීම පිළිබඳව විශාල අවධානයක් යොමුවෙනවා.

අපේ දරුවන්ගේ මානසික හා ශාරීරික සෞඛ්‍යය, අධ්‍යාපනය කඩාවැටීම තවදුරටත් බලා ඉන්න බැහැ. ඒ සම්බන්ධයෙන් හඬ නගන කාන්තාවන්ට සවන් නොදී, බලය යෙදවීමට එරෙහිව සියලු දෙනා එක්විය යුතුයි. කාන්තාවන්ට පමණක් නොව වෙනත් සියලුම සාමකාමී උද්ඝෝෂණවලට මර්දනය දියත් කිරීම ආණ්ඩුවේ එකම පිළිතුර වී තිබෙනවා.

## තොපේ මර්දනය අපේ පන්නරයයි

### නීතිඥ චමිලා කුලසේකර

දරුවෙකුට ආහාර වේලක් දෙන්න යද්දී මව කොතරම් අසරණ වෙනවා දැයි කාන්තාවන් දන්නවා. අත්‍යවශ්‍ය ඇඳුමක්, බේත්හේත්, අධ්‍යාපනයට පොත්පත්, ලබාදීමට නොහැකි අවස්ථාවල අසීමිතව අසරණ වෙනවා. රට ආර්ථික වශයෙන් වැට්ටීම නිසා කාන්තාවන් අද අන්ත දරිද්‍රතාවයට පත්වෙලා. මේ දක්වා පාලන බලය හෙබවූ ආණ්ඩුවල සිටි මහජන නියෝජිතයන් අපේ හඬ නැගුවේ නැහැ; තමන්ගේ කටයුතු කරගත්තා විතරයි. රටේ 52%ක් වන කාන්තාවන් වෙනුවෙන් ඔවුන් කිසිදිනෙක කටයුතු කළේ නැහැ. මේ නිසා අද අපි පැමිණ සිටින්නේ අපි වෙනුවෙන් අපි සිටගත යුතුයි තැනටයි. මේ පහර දීමේ අවස්ථාවට පොලිස් කාන්තාවන් යොදවා සිටියා. කාන්තාවන්ගේ කුසෙන් බිහිවුණු පොලිස් නිලධාරීන් තමයි හිටියේ. අපට දැනෙන අමාරුකම් මේ නිලධාරීන්ට දැන්නේ නැද්ද? පාලකයන්ගේ අවශ්‍යතාවලට හිස නමන්න පොලීසිය යොදවා තිබෙනවා. නමුත් අපි මේ රනිල් රාජපක්ෂ ආණ්ඩුවට එක දෙයක් තහවුරුකර කියනවා. "තොපේ මර්දනය අපේ පන්නරයයි." කාන්තාවන් මීට වඩා ධෛර්යසම්පන්නව සවිමත්ව ඉදිරියට එන බව අවධාරණය කරනවා.

## පොලිස් ජල ප්‍රහාරයට එරෙහිව මූලික අයිතිවාසිකම් පෙත්සමක් ගොනුකරනවා

### නීතිඥ නිලන්ති කොට්ටහච්චි

රාජ්‍ය ප්‍රතිපත්තිවල මූලික මූල ධර්මයක් ලෙස පවුල පිළිගෙන තිබෙනවා. නමුත් එම වැදගත්ම ඒකකය අමතක කොට දමා කටයුතු කළ ආකාරය, ළමුන් සහ කාන්තාවන් කෙරෙහි දක්වන ආකල්පය ජාත්‍යන්තර වශයෙනුත් පැහැදිලි වුණා. මේ ප්‍රහාර හෙළාදැකීමෙන් පමණක් ජාතික ජන බලවේගය නතර වන්නේ නැහැ. ජාතික ජන බලවේගයේ නීතිඥයෝ හැටියට නුදුරු දිනෙකදී මේ පහරදීමට එරෙහිව මූලික අයිතිවාසිකම් පෙත්සමක් ගොනුකරනවා. ඒ වගේම ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සහ පොලිස් ආඥා පනත සම්බන්ධයෙන් මූලික මඟපෙන්වීමක් ජනතාවට ලබාදෙන්නත් ක්‍රියාකරනවා. නීතිය ක්‍රියාත්මක කරවන්නන් හට එමගින් නීතිය පැහැදිලි කර දෙන්නත් අපේක්ෂා කරනවා. මේ ආණ්ඩුව තවදුරටත් පාලනයේ සිටීමට සුදුසු නැහැ. මේ රටේ ජනතාවගේ ආණ්ඩුවක් පිහිටුවා ගැහැනුන්ගේ ශක්තියට නිසි ඇගයීමක් දෙන්න අපි බලාපොරොත්තු වෙනවා.

## විරෝධය පළ වූයේ ආණ්ඩුවේ අසීමිත පීඩනයට එරෙහිවයි

### නීතිඥ නිමලා සිරිවර්ධන

හිටපු ජනාධිපතිවරු සිවුදෙනෙක් සහ ජනාධිපති බිරිඳක් නඩත්තු කරන්න 2023 වර්ෂයේදී වෙන්කර තිබුණු රුපියල් මිලියන 84 ලබන වර්ෂය සඳහා රුපියල් මිලියන 110ක් දක්වා වැඩිකර තිබෙනවා. හිටපු ජනාධිපතිවරු සහ පැනලා ගිය ජනාධිපති වෙනුවෙන් වෙන්කරන මුදල් වැඩිකරන අතර මේ රටේ ජීවනාලිය වන ළමා හා කාන්තා පරපුරට වෙන්කරන මුදල් 50%කින් කපාහැර තිබෙනවා. සෞඛ්‍ය සහ අධ්‍යාපනය සම්බන්ධයෙන් පවතින පීඩනය වැඩිවශයෙන් දැනෙන්නෙත් කාන්තාවන්ට. තිබුණු ප්‍රතිපාදනත් කපා හැරීම තුළින් කාන්තාවන් මත තිබෙන පීඩනය තවදුරටත් ඉහළ නංවනවා. මෙයට එරෙහිව පවතින ආණ්ඩුවට බල කිරීමේ අයිතියක් අපට තිබෙනවා. අපි සිදුකළේ ආණ්ඩුව ගෙනයන වැරදි කප්පාදු කිරීම්වලට එරෙහිව විරෝධය දැක්වීමයි.

නියමුවා
ජනතා විමුක්ති පෙරමුණේ මධ්‍යම පුවත්පත
464/20. පන්නිපිටිය පාර පැලවත්ත. බත්තරමුල්ල දුර. 0112-785612 Email: niyamuwanews@gmail.com

# නව වසර ඉතිහාසය අලුතින් ලියන වසරක් කරමු

2024 නව වසර එළඹෙන්නේ අභියෝග රැසක් හා එම අභියෝග දිනන අවස්ථාවක්ද රැගෙනය. ආර්ථික පීඩනයේ වේදනාව සහ කෝපය සමග නව පාලනයක් බිහිකිරීමේ උස් බලාපොරොත්තුවද සහිතවය. හැම වසරකම පුරුද්දට සුබ නව වසරක් පැතූ ජනතාවට මෙම නව වසර සැබෑ ලෙසම සුබ කර ගැනීමේ අවස්ථාව පැමිණ තිබේ යැයි අපි සිතමු.

නව වසරේ අභියෝග විශාලය. පසුගිය 2022 වසර තුළ පුපුරා ගිය ආර්ථික අර්බුදය තවදුරටත් වර්ධනය වෙමින් තිබෙන අතර රනිල් - රාජපක්ෂ පාලනය විසින් අර්බුදයේ සමස්ත බර ජනතාව මත පටවනු ලැබ තිබේ. 2024 නව වසර එළඹෙන්නේ අයිඑම්එෆ් එකඟතාවලට අනුව වැඩිකරන ලද වැට් බදු බරද සමගය. වැට් බද්ද 15% සිට 18% දක්වා වැඩිවෙන අතර මෙතෙක් වැට් බද්ද පනවා නොතිබූ භාණ්ඩ වර්ග 97කට අලුතින්ම බදු පැනවේ. ඒ භාණ්ඩ අතර ඩීසල්, පෙට්‍රල්, විදුලි බිල, පාසල් උපකරණ, කෘෂි උපකරණ පොහොර හා ආදාහන කටයුතුද වේ.

රනිල් -රාජපක්ෂ බදු ගැහිල්ලේ තරම කෙතරම්ද යත් ජීවත්ව සිටින තාක් කල් පමණක් නොව මියගිය පසුද බදු ගෙවීමට ජනතාවට සිදුවේ.

අලුතින් පැනවෙන බදු බරත් සමග ප්‍රවාහන ගාස්තු ඉහළ යාම, නිෂ්පාදන පිරිවැය ඉහළ යාමත් එකතු වූ විට අත්‍යාවශ්‍ය භාණ්ඩවල මිල දරාගැනීමට නොහැකි තරමින් ඉහළ යාම සිදුවේ. එවිට ජනතාවට තවදුරටත් ජීවත්වීමට නොහැකි තත්වයක් ඇතිවීම නොවැළැක්විය හැකිවේ.

මේ සමග දැනටමත් බිඳවැටෙමින්, වැසී යමින් පවතින දේශීය කර්මාන්ත ව්‍යාපාර හා කෘෂිකර්මාන්තය පවා අවසන් හුස්ම හෙළන තත්වයට පත්වනු ඇත.

ආර්ථිකයේ දිගින් දිගට සිදුවන මෙම විශාල කඩා වැටීමත්, භාණ්ඩ හා සේවාවල මිල ඉහළ යාමත් විසින් ජනතාවට තව දුරටත් පැරණි ක්‍රමයෙන් ජීවත්වීමට බැරි තත්වයක් උදාවන බවද පැහැදිලිය. එවිට සමාජ සංස්ථාව තව දුරටත් කඩා වැටී අපරාධ, හොරකම්, වංචා ආදියද ඉහළ ගොස් ජනතාවට තම අනාගතය පිළිබඳ නැවත සිතීමට බලකරන තත්වයක් නිර්මාණය වනු ඇත.

දැනටමත් සිදුවෙමින් තිබෙන පරිදි මෙම අර්බුද හා අභියෝග විසින් ජනතාවට ජීවිතයේ විශාල අත්දැකීම් උගන්වනු ඇත. වසර 75ක් තිස්සේ පවත්වාගෙන ආ තට්ටුමාරු දේශපාලන ගමන තවදුරටත් රැගෙන යන්නේද යන්න පිළිබඳ ගැඹුරින්ම සිතා බැලීමට සමස්ත පුරවැසියාට මේ තත්වය විසින් බල කරනු ඇත.

එසේම 1978 සිට පවත්වාගෙන යන මේ නව ලිබරල්වාදී කොල්ලකාරී ආර්ථික ක්‍රමයත් ඒ මත නිර්මාණය කර ඇති දූෂිත මජර දේශපාලන සංස්කෘතියත් තවදුරටත් ඉවසා සිටිනවාද නැද්ද යන්න තීරණය කිරීමටද ජනතාවට මෙම තත්වය බලකරනු ඇත.

රටක් සතු සියලුම සම්පත් විදේශ රටවලට, සමාගම්වලට විකුණා දමමින්, බදු දෙමින් තව තවත් ණය ගනිමින් රටක් හා ජනතාවක් ප්‍රපාතයට විනාශයට ඇදගෙන යන වර්තමාන පාලන ක්‍රමය තවදුරටත් ඉවසා සිටින්නේද යන්න තීරණය කිරීමටද ජනතාවට සිදුවනු ඇත.

ඉතින් මේ සියලු විනාශයන්ගෙන්, අර්බුදයන්ගෙන් රට මුදාගෙන අභියෝග ජයගනිමින් අලුත් ආර්ථික දේශපාලන ගමනක් ආරම්භ කිරීමේ අවස්ථාවද මේ නව වසරේම ජනතාවට උදාවී ඇත. ඒ, ව්‍යවස්ථාවට අනුව පැමිණීමට නියමිත අනිවාර්යක් වූ ජනාධිපතිවරණයයි. එම ජනාධිපතිවරණය අපේ රට අලුත් මඟකට, ජයග්‍රාහී මඟකට යොමු කිරීමේ මඟහැර යා නොහැකි අවස්ථාව වනු ඇත.

රටක ඉතිහාසය ගොඩනගන්නේ ජනතාව විසින් බව සැබෑය. එහෙත් අපේ රටේ ඉතිහාසයේ ගමන් මඟ තීරණය කළේ දූෂිත පරපුටු ප්‍රභූ පාලක පිරිසක් විසිනි. එබැවින් එම වැරැදි ඉතිහාසය ජනතාව විසින්ම නිවැරදි කළ යුතු, නිවැරදි කළ හැකි, ඉතිහාසය අලුතින් ලිවිය හැකි වසරක් බවට මෙම වසර පත්ව තිබේ. 2024 නව වසර සැබැවින්ම ඉතිහාසයෙන් පාඩම් ඉගෙනගත් ජනතාවක් විසින් අඳුරු අතීතය වෙනස් කර පැහැබර අනාගතයක් උදෙසා ඉතිහාසය අලුතින් ලියන, ඉතිහාසය අලුතින් ගොඩනගන, වසරක් බවට පත්කර ගත යුතුයයි අපි උදක්ම විශ්වාස කරමු. ඒ සඳහා ජනතාව අධිෂ්ඨානයෙන් පෙළගැසෙමින් එන පෙර මඟ ලකුණුද අපි දැන් දකිමින් සිටිමු.

එබැවින් අඳුරු වේදනාබර අතීතය වෙනස් කර මෙරට ඉතිහාසය අලුතින් ලියන්නට ධෛර්යයෙන් සේම ශක්තිමත්ව පෙරට එන සියලු ප්‍රගතිගාමී බලවේගයන්ට, සියලු ගැහැනුන්ට, මිනිසුන්ට ඒ වෙනුවෙන් මේ නව වසරේ අපි සුබ පතමු.

# රටට නව දේශපාලන පරිවර්තනයක් අවශ්‍යයි



## ජනතා විමුක්ති පෙරමුණේ නායක අනුර කුමාර දිසානායක සහෝදරයා

***ආර්ථිකය හැකිළෙමින් යන අතර ආණ්ඩුව ජනතාව මත තව තවත් බදු බර පටවමින් ඔවුන් සතු අවසන් රුපියලත් එකතු කරමින් සිටිනවා. මේ තත්වය ජනතාව කෙසේ දරා ගනීද? ඔවුන්ගේ ප්‍රතිචාරය කෙසේ වෙයිද?***

රනිල් වික්‍රමසිංහ ආණ්ඩුවේ සැලැස්ම බවට පත්වී තිබෙන්නේ ගිණුම් තුලනය කිරීම. එසේ නැතිව ආර්ථික දේහයේ මතුවී තිබෙන ගැටලුවලට ක්‍රමික විසඳුම් ලබාදෙමින් මෙම ප්‍රශ්නයෙන් ගොඩඒම සඳහා ඔවුන් ප්‍රයත්නයක් නොදරන බව පැහැදිලියි. ආණ්ඩුවට ගිණුම් තුලනය කර ගැනීම සඳහා ආදායම් සහ වියදම් අතර පරතරය අඩුකර ගනිමින්, ඉදිරියට යන්න සිදුවෙනවා. ආණ්ඩුව මෙවර ආදායම ලෙස රුපියල් මිලියන 40,164ක් අපේක්ෂා කරනවා. නමුත් ආර්ථිකය තිබෙන්නේ 2019ටත් වඩා පසුපසින්. ජාතික නිෂ්පාදිතය 2019ටත් වඩා අඩු තත්වයක තිබිලා ඔවුන් රුපියල් මිලියන 40,164ක් ලබා ගැනීමේ ඒකායන මාර්ගය බවට පත්කරගෙන තිබෙන්නේ ජනතාව මත අසීමිත ලෙස බදු බර පැටවීමයි.

විශේෂයෙන්ම පසුගිය කාලයේ වැට් බද්ද ක්‍රියාත්මක කරන කොට අත්‍යාවශ්‍ය භාණ්ඩ හා සේවා 138ක් නිදහස් කොට තිබුණා. නමුත් පසුගියදා සම්මත කර ගත් බදු සංශෝධන පනත අනුව වැට් බදු නිදහස්ව තිබුණු භාණ්ඩ හා සේවා කාණ්ඩ 138න් 97ක් ඉවත් කරනු ලැබුවා. ඩීසල්, පෙට්‍රල්, ගෑස්, විදුලිය, රෝහල් උපකරණ, පුස්තකාල සේවා, පොත් මුද්‍රණය, කිරි නිෂ්පාදන ආදී ජන ජීවිතයත් එක්ක ඉතාමත් සමීප භාණ්ඩ හා සේවා වැට් බද්දට අලුතින් එකතු කළා. මීට පෙර පැවති ආණ්ඩු එම භාණ්ඩ හා සේවා කාණ්ඩ 97 වැට් බද්දෙන් නිදහස් කර තිබුණේ ජන ජීවිතයට සහ ආර්ථිකයට ඉතාමත් සංවේදී ක්ෂේත්‍ර නිසයි. නමුත් ආණ්ඩුව එම කාණ්ඩ 97ට 18%කම වැට් බද්දක් අලුතින් පැනවීම අපේ රටේ ආර්ථිකයටත් ජන ජීවිතයටත් විශාල ප්‍රශ්න ඇති කරනවා. ඒ වගේම පොදුවේ වැට් බද්ද 18% දක්වා වැඩි කළා. මේ නිසා එදිනෙදා අත්‍යවශ්‍ය වන භාණ්ඩ හා සේවා ජනතාවට මිලදී ගත නොහැකි තත්වයක් උදාවෙනවා. ඒ වගේම අසීමිත ලෙස බදු පැනවීමෙන් නැවත ආර්ථිකය සංකෝචනය කිරීමටත් අපේක්ෂා කරන ලද ප්‍රතිඵල නොලැබීමටත් හේතු වෙනවා.

මේ වැට් බදු පැනවීමට පෙරත් ජනතාව ජීවත් වෙමින් සිටින්නේ ඉතාමත්ම අසීරුවෙන්. එමනිසා හිඟන්නාගේ පාත්තරයට හෙනහුරා කඩා වැදුණා වගේ ජනතාවගේ ජන ජීවිත පොඩිපට්ටම් කරගෙන යන ආකාරයට නව බදු පනවා තිබෙනවා. ජනතාව තවදුරටත් මේ පීඩනය ඉවසයිද? එසේත් නැත්නම් ජනතාව තමන්ගේ ජීවත් වීමේ අයිතිය වෙනුවෙන් ඉදිරියට එනවාද කියන ප්‍රශ්නය වළක්වන්න බැහැ. විශේෂයෙන්ම ජාතික ජන බලවේගය ජනතාවගේ ජීවත්වීමේ අයිතිය වෙනුවෙන් දිස්ත්‍රික් මට්ටමේ උද්ඝෝෂණ මාලාවක් සංවිධානය කර, සටන් වදින්න තීරණය කර තිබෙනවා. ඒ වගේම දීර්ඝ කාලයක් අනුගමනය කරන ලද මේ ආර්ථික ප්‍රතිපත්තිය වෙනස් කොට, අපේ රටේ භාණ්ඩ හා සේවා නිෂ්පාදනයට විශාල වර්ධනයක් අත්පත් කරගෙන නව ආර්ථික සැලැස්මකට ප්‍රවිෂ්ට වීමකින් තොරව මෙම අර්බුදයෙන් ගොඩඑන්න බැහැ. ඒ නිසා නව ආර්ථික උපායමාර්ගයක් දක්වා මේ රට පරිවර්තනය කිරීමට පෙළගැසෙන ලෙස ජනතාවට අපි ආරාධනා කරනවා. ජීවත් වීමේ අයිතිය වෙනුවෙන් ජනතාව පාරට බහින එක, අනිවාර්ය ලෙස අරගල කරන එක නතර කරන්න බැරි බව අපි අවධාරණය කරනවා.

***එළඹෙන 2024 වර්ෂය සැලකෙන්නේ ශ්‍රී ලාංකේය දේශපාලනයේ විශාලතම බල පෙරළිය සිදුවීමට නියමිත වසර ලෙසයි. මෙ පිළිබඳ ඔබේ කියවීම කවරාකාරද? ජාතික ජන බලවේගයේ ඒ සඳහා වන සූදානම කෙසේද?***

ලබන 2024 වර්ෂයේ ප්‍රධාන මැතිවරණ දෙකක් පැවැත්වීමට නියමිතව තිබෙනවා. විශේෂයෙන්ම ජනාධිපතිවරණය හා එම මැතිවරණයෙන් කවර පාර්ශ්වයක් ජය ගත්තත් ඒ විගසම පාර්ලිමේන්තු මැතිවරණය පැවැත්වෙනවා. දීර්ඝ කාලයක් අපේ රටේ ජනතාව ආණ්ඩු වෙනස් කිරීම්, පාලකයන් වෙනස් කිරීම්, මගින් විවිධ බලාපොරොත්තු සහිතව ආණ්ඩු සහ නායකයන් වෙනස් කළා. නමුත් අවසානයේ ජනතාවට සිදුවී තිබෙන්නේ තමන්ගේ ජීවිතවල මූලික වුවමනා හෝ ඉටුකර ගන්න බැරි තරමට ආර්ථිකය බංකොලොත් වීමයි. මුහුණුවර දෙකකින් පෙනී සිටියත්, එකම පාලක කණ්ඩායමක් වන මේ කණ්ඩායම් දෙකට තවදුරටත් ජනතාව ඉදිරියේ කියන්න කතාවක් නැහැ. මීට පෙර ඔවුන් කියූ 'ජාතිය බේරා ගැනීම සඳහා' ඡන්දය දෙන්න, 'ආර්ථික සංවර්ධනය අත්පත් කර ගැනීම සඳහා' ඡන්දය දෙන්න, 'ආසියාවේ ආශ්චර්ය බවට පත්කරන්න' ඡන්දය දෙන්න ආදී වශයෙන් කියූ කතා වලංගු නැහැ. නමුත් දැන් ජනතාවට කියන්න කිසිදු කතන්දරයක් ඔවුන්ට නැහැ. ලංකා ඉතිහාසයේ එකම කඳවුරේ මේ දෙපාර්ශ්වය දේශපාලන වශයෙන් ඉතාමත් දුගීභාවයට පත්වී සිටිනවා. අනික් පැත්තෙන් ජනතාව තුළ ඔවුන්ට තිබෙන විරෝධය සහ ඔවුන් කෙරෙහි තිබූ අවිශ්වාසය විශාල ලෙස වර්ධනය වී තිබෙනවා.

ඒ නිසා ලබන වසර නව පරිවර්තනයක් සඳහා වන වසරක් බවට පරිවර්තනය කර ගත හැකි බව අපි විශ්වාස කරනවා. අපිට අවශ්‍ය කවර වර්ගයේ පරිවර්තනයක්ද? ඒ නිසා මෙම වසර අනිවාර්යයෙන්ම නව සමාජ ආර්ථික පරිවර්තනයක් සඳහා වූ පෙළගැස්මක වසරක් බවට පත්වීම ඒකාන්තයි. ඒ නිසා මේ වසර 75 වසරක සාපය නිමා කරන වසර බවට පත්කර ගත හැකියි කියන දැඩි විශ්වාසය අපට තිබෙනවා.


***විදෙස් රටවල් ජාතික ජන බලවේගය සම්බන්ධයෙන් දක්වන උනන්දුව මගිනුත් රට තුළ ජනමත විමසුම් මගිනුත් ලාංකේය දේශපාලනය තුළ ජාතික ජන බලවේගයේ තීරණාත්මක භූමිකාව ප්‍රකට වෙමින් තිබෙනවා. නව වසර වෙනුවෙන් ඔබ ජනතාවට දෙන පණිවිඩය කුමක්ද?***

ඔව්. ජාතික ජන බලවේගය ඉතාමත් වේගයෙන් අපේ රටේ බලය අත්පත් කර ගැනීම දක්වා වූ දැවැන්ත ජනතා ප්‍රතිචාරයක් අත්පත් කර ගනිමින් සිටිනවා. විදෙස්ගත ශ්‍රී ලාංකිකයන් තුළ, ග්‍රාමීය ජනතාව තුළ, මැද පාංතික ජනතාව තුළ වගේම වෘත්තියවේදීන්, බුද්ධිමතුන් තුළ කර්මාන්තකරුවන් හා ව්‍යාපාරිකයන් තුළ සහ විශේෂයෙන්ම ආගමික ප්‍රජාවන් තුළ ඔවුන් මේ පරිවර්තනය සඳහා මැනෙවින් සූදානම් වෙමින් සිටිනවා. අපේ රටට අවශ්‍ය වන්නේ කුමන වර්ගයේ පරිවර්තනයක්ද? අපේ රටේ ජනතාව දීර්ඝ කාලයක් අපේක්ෂාවන් සහිතව ආණ්ඩු සහ නායකයන් මාරුකර තිබෙනවා. නමුත් ආපසු හැරී බලනවිට ජනතාවගේ අපේක්ෂා මුළුමනින්ම බිඳ වැටුණු රාජ්‍යයක් අප ඉදිරියේ නිර්මාණය වී තිබෙනවා.

ඒ නිසා අපට දැන් අවශ්‍ය වන්නේ මේ සමාජ ආර්ථික, දේශපාලන ගමන මුළුමනින්ම පරිවර්තනය කරන ගමනක්. එය හුදු දේශපාලන පක්ෂයක ක්‍රියාකාරිත්වයක් පමණක් නොවෙයි. මේ රටේ පොදු ජනයාගේ ක්‍රියාකාරිත්වයක් බවට පත්විය යුතුයි. උතුරෙත් දකුණෙත් නැගෙනහිරත් සිංහල, දෙමළ, මුස්ලිම් ජන කොට්ඨාස භේද, ආගම් භේද හෝ කුලමල භේද පසෙකලා අපේ රට ව්‍යසනයට පත්කරන ලද වෛර

**රටට නව දේශපාලන පරිවර්තනයක් අවශ්‍යයි. ජාතික ජන බලවේගය මෙම මැතිවරණවලට තරග වදින්නේ අන්න ඒ ජාතික ඒකාග්‍රතා සහිත නව පන්නයේ ජාතික නිදහස් අරගලයක ස්වරූපයෙන් සහ මැදිහත්වීමෙන්. මෙය හුදු ආණ්ඩු මාරුවක් හෝ හුදු නායකයන්ගේ මාරුවක් නොවේ.**

11 වැනි පිටුවට



YES WE CAN

# යුක්තිය කාටද?

"යුක්තිය" ආණ්ඩුවේ වර්තමාන දේශපාලන සටන් පාඨයයි. නමුත් රටේ ආර්ථිකය ඇත්තේ මරණාසන්නවය. ඊට සාපේක්ෂව ජන ජීවිතද ඇත්තේ මරණාසන්නවය. දිනෙන් දින උග්‍ර වන ආර්ථික අර්බුදයට මුහුණදීමට අසමත් ආණ්ඩුව, ආණ්ඩුවේ ආදායම් වැඩිකරගැනීම වෙනුවෙන් බදු ප්‍රතිශත වැඩි කිරීමත්, නව බදු ක්‍රම හඳුන්වාදීමත්, බදු අය නොකළ භාණ්ඩ හා සේවා මගින් බදු අය කිරීමට තීරණය කිරීමත් නිසා රටේ ජනතාවට "යුක්තිය" ඉටු වනවා වෙනුවට ඉතාම අයුක්ති සහගත ආර්ථික වුවමනාවක් වෙනුවෙන් වෙහෙස වීමට සිදු වී ඇත.

එසේම මෙම බදු ප්‍රතිපත්ති නිසා අපේ රටේ මහාපරිමාණ කර්මාන්ත මෙන්ම, කුඩා හා මධ්‍ය පරිමාණ කර්මාන්ත වේගයෙන් වැසී යාමේ තර්ජනයක් මතු වී ඇත. මේ තත්ත්වය නිසා රැකියා අහිමි වීම ගිය වසරට සාපේක්ෂව සීඝ්‍ර ලෙස වැඩි වී ඇතැයිද ගෙවුණු වසර දෙකට පමණක් විරැකියාව ලක්ෂ විස්සකට වඩා වැඩි වී ඇතැයිද ආර්ථික විස්ලේෂකයෝ පෙන්වා දෙති. ඊට අනුව මෙම අවදානම මෙම වසරේදී ඉතාම බරපතළ වනවා ඇත.


මෙසේ ලක්ෂ ගණනින් රැකියා අහිමි වී ඇති තත්වයක් තුළ, ඉදිරියේදීත් රැකියා අහිමිවීමේ අවදානමක් ඇති වී ඇති තත්ත්වයක් තුළ අපේ රටේ විෂ මත්ද්‍රව්‍ය තුරන් කිරීම යනු ඉතා අවිද්‍යාත්මක මැදිහත්වීමකි. මෙය හුදු දේශපාලන සටන්පාඨයක් පමණි. දිනෙන් දින ආර්ථිකය අර්බුදයට ගොස් රැකියා අහිමි වෙද්දී, සාමාන්‍ය ජන ජීවිත කීතු කීතු වී යාම වළක්වාලිය නොහැක. එසේ කීතු වන ජන ජීවිත මත් වීම තම ජීවිතය බවට පත්කර ගැනීම වළක්වාලිය නොහැක. යහපත් ආර්ථික ජීවිතක් ලබා නොදී යහපත් සමාජයක් බලාපොරොත්තු වීම විහිළුවකි.

මීට පෙරද මෙවැනිම ඊනියා සටන් පාඨ ගෙන එනු ලැබිණි. "මතට තිත""මතින් තොර රටක්" හුදු සටන් පාඨයයන් විය. "මතට තිත" ක්‍රියාත්මක වූයේ ගමේ කාලක් බොන, ජීවත් වීම වෙනුවෙන් දිනක්ට සොච්චමක් සොයාගත් වුන් වෙනුවෙන් පමණි. මතට තිත තැබීමට නොහැකි විය. නමුත් නිමල් ලන්සා වැනි උන් වෙනුවෙන් ඒ මොහොතේත් "යුක්තිය" ඉටු විය. මේ වෑයමත් එවැනිම කුඩු මුදලාලිලාට "යුක්තිය" ඉටු කිරීම වෙනුවෙනි.

දිනෙන් දින හීන වන ජනතා ආකර්ෂණයක් ඇති රනිල් රාජපක්ෂ ප්‍රමුඛ ආණ්ඩුවට ජනතාව හමුවට යෑමට කිසිදු සටන් පාඨයක් නොමැත. ක්‍රියාත්මක කිරීමට ඇති ආර්ථික ප්‍රතිපත්ති විසින්ද තිබෙන ජනතා ආකර්ෂණයද අහිමි වී යන්නේය. මේ නිසා ජනතාවට ආකර්ෂණය, ජනතාවට සංවේදී සටන්පාඨයක් ලෙස ඇත්තේ කුඩු, අයිස්, ගංජා වැටලීම බව දන්නා පාලකයෝ මීළඟ බල ව්‍යාපෘතිය වෙනුවෙන් "යුක්තිය" නැමැති ඊනිසා දේශපාලන සටන්පාඨය ක්‍රියාත්මක කරමින් සිටිති. "යුද්ධයෙන් රට බේරාගත් නායකයා", "අන්තවාදයෙන් රට බේරාගත් නායකයා" මෙන් "කුඩුවලින් රට බේරාගත් නායකයා" ලෙස රනිල් රාජපක්ෂට නැවත ඔටුනු පැළඳවීම වෙනුවෙන් දරන ඊනියා උත්සාහයක් පමණි. අවසානයේ " යුක්තිය" ඉටු වන්නේ උන්ට පමණි.

## නව වසට නව පැතුම...

විසිතුනෙන් විසිහතර
එළඹෙන්න කලියෙන්
හිතන්නට බොහෝ ඇත
ගෙවා දැමූ වසරක
සුන් වී විසිරුණ පැතුම්...
තවත් එක් වසරක්
නොවී දුක් බොන දනට
උදා කළ යුතුව ඇත
පැතුම් පිබිදී හිනැහෙන
නව බිමක පැතුමක්...
සහතිකයි දිනන බව
සත්‍යය කෙසේ හෝ හනික
බලා නොඉඳම පසෙක
උදාකරගත යුතුය නව
මඟ...
දිරිය ගෙන එඩි පා බිම
සහස් අත් ඔසවා මිටින
බිඳ දමමු මේ දුක්බ
පර්වත
නෙළා ගැනුමට
අපේ ලොව හෙට..




## දේශපාලන හයියෙන් අලි රක්ෂිතයේ ගල්කොරි




2021 අප්‍රේල් 9 වෙනිදා ගැසට් කරනු ලැබූ හම්බන්තොට අලි කළමනාකරණ රක්ෂිතය තුළ දේශපාලන බලයෙන් සිදුවන මහ පරිමාන ගල් කොරි පවත්වාගෙන යෑම, මහා පරිමාණ වගාවන් සඳහා ඉඩම් එළි පෙහෙලි කිරීම ආදී විනාශකාරී ක්‍රියාකාරම් සිදුවෙමින් ඇත. ඊට ඉඩ ලබා දීම පිළිබඳ වගකිවයුතු ආයතනවලින් විමසීම සඳහා පසුගිය දෙසැම්බර් 20 වැනිදා සමාජවාදී තරුණ සංගමය හා පරිසර සංවිධානවල සමාජිකයෝ පිරිසක් එම ආයතනවල නිලධාරීන් හමු වූහ.

එහිදී ඔවුන් විසින් කළ ප්‍රශ්න කිරීම් හමුවේ ලබා දුන් පිළිතුරුවලින් පෙනී ගොස් ඇත්තේ, ඇතැම් වගාවන් ඉවත් කිරීමට කටයුතු කර ඇතත් දේශපාලන බලයෙන් ක්‍රියාත්මක වන ගල්කොරි හෝ මහා පරිමාණ වගාවත් තවදුරටත් ක්‍රියාත්මක වන බවය. දූෂිත දේශපාලඥයන්ට සෘජු ලෙස සම්බන්ධ මෙම ව්‍යාපෘතිවලට එරෙහිව කටයුතු කිරීමට එම ආයතන නිලධාරීන්ට මේ වන තෙක් නොහැකි වී ඇති බවත් එම විනාශය වැළැක්වීමට එම රාජ්‍ය ආයතන කිසිදු පියවරක් මේ වන තෙක් නොගෙන ඇති බවත්ය.

එම සතිය තුළ පමණක් අලි පහර දීම් දෙකක් සූරියවැව සහ වල්සපුගල ප්‍රදේශවලින් වාර්තා වී ඇති අතර ඉන් එක් පුද්ගලයෙක් මියගොස් ඇත. මෙම අලි මිනිස් ගැටුමට විසඳුමක් ලෙස යෝජනා වූ, ගැසට් පත්‍රයකට පමණක් සීමා වී ඇති මෙම අලි කළමනාකරණ රක්ෂිතයට අවශ්‍ය නීති රෙගුලාසි පනවා අලි ඇතුන්ට නිදහසේ ගමන් කිරීමටත් ජීවත් වීමටත් අවශ්‍ය පරිසරය ආරක්ෂා කර, අලි මිනිස් ගැටුම නවතා, ගොවියන්ගේ ගොවි බිම්ද, මිනිස් ජීවිතද, අලි සම්පතද රැක ගැනීම සඳහා නැවතත් ජනතාවට අරගලයක් කිරීමට සිදු වන බව ඔවුහු ප්‍රකාශ කළෝය.

ඒ සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීමට සමාජවාදී තරුණ සංගමයත් පරිසර සංවිධාන එකතුවත් කටයුතු කරන බවත් මෙය විසඳීමට අවශ්‍ය කඩිනම් ක්‍රියාමාර්ග ගන්නා ලෙස පාලකයන්ට බල කර සිටින බවත් ප්‍රකාශ මෙහිදී අවධාරණය කෙරිණි.

මෙහිදී සඳහා සමාජවාදී තරුණ සංගමයේ ජාතික සංවිධායක එරංග ගුණසේකර, ජාතික කමිටු සාමාජික මලින්ද ජීවන්, හම්බන්තොට දිස්ත්‍රික් කමිටු සමාජිකයන් වන සුරංග සංජීව සහ සුමිත් කුමාර යන සහෝදරවරු අදහස් දැක්වූහ.

## ස්පාඤ්ඤයේ තරුණ කොමියුනිස්ට්වාදී සමුළුවට SYU සුබපැතුම්




පසුගිය දෙසැම්බර් 7 වන දින සිට 10 වන දින දක්වා ස්පාඤ්ඤයේ තරුණ කොමියුනිස්ට්වාදීන්ගේ සංගමයේ විශේෂ සමුළුවක් පැවැත්විණි. ඒ සඳහා සමාජවාදී තරුණ සංගමය නියෝජනය කරමින් අසංකා වීරසිංහ සහෝදරිය සම්බන්ධ වූවාය. මෙහිදී ඇය සමාජවාදී තරුණ සංගමයේ හා සමාජවාදී ශිෂ්‍ය සංගමයේ සුබපැතුම් එම සමුළුවට එක්කළාය. මෙම සමුළුවට සම්බන්ධ වූ ජාත්‍යන්තර නියෝජිතයින්ගේ සහභාගිත්වයෙන් 'සමාජ ප්‍රජාතන්ත්‍රවාදයේ ඓතිහාසික සීමා සහ තරුණයින් විප්ලවයෙන් අපගමනය වීම' මැයෙන් පැවත්වූ සම්මන්ත්‍රණයේදීද ඇය සිය අදහස් දැක්වූවා තිබිණි. එහිදී එම තරුණ සංවිධානය සමග සාකච්ඡා සිදුකිරීම සහ සබඳතා ශක්තිමත් කරගැනීමද සිදුවිය. මේ වන විට ලෝක ප්‍රජාතන්ත්‍රවාදී තරුණ සම්මේලනයේ සභාපතිත්වය දරන සංවිධානය වන්නේද ස්පාඤ්ඤයේ තරුණ කොමියුනිස්ට්වාදීන්ගේ සංගමයයි.

## පලස්තීනයට සහයෝගය පතා SYU විසින් වැඩසටහන් මාලාවක්




පලස්තීනයට එරෙහි ආක්‍රමණකාරී යුද්ධය වහා නවතනු! සාමය උදෙසා ස්වාධීන පලස්තීනය ස්ථාපිත කරනු! යන මැයෙන් ජාත්‍යන්තර පලස්තීන සහයෝගීතා දිනය වෙනුවෙන් පසුගිය දෙසැම්බර් 10 වැනි සම්මන්ත්‍රණය හා සංස්කෘතික වැඩසටහනක් කොළඹ ඩෙන්සිල් කොබ්බෑකඩුව ශාලාවේදී පැවැත්විණි. ඒ සඳහා පලස්තීන තානාපති සුහයිර් මොහමඩ් මහතා ඇතුළු විද්වතුන් රැසක් සහභාගි වූ අතර එහිදී පලස්තීනය පිළිබඳ ප්‍රදර්ශන කුටියක්, චිත්‍ර අඳින වැඩසටහන්ද ඇතුලත් විය. ඊට සමගාමීව රට පුරා ප්‍රධාන නගර රැසක සහයෝගිතා වැඩසටහන් පවත්වනු ලැබීමද විශේෂත්වයක් විය.




### මරණ දිනය පුරෝකථනය කරන AI මෙවලම




කෘත්‍රිම බුද්ධිය (AI) ලිපි ලිවීමට, ව්‍යාපාරික කටයුතුවලට සහ චිත්‍රපට සඳහා පමණක් සීමා නොවේ. එය පුද්ගලයෙකුගේ ආයු කාලය පවා පුරෝකථනය කළ හැකිය. පර්යේෂකයන් විසින් AI මෙවලමක් නිපදවා ඇති අතර එය සෞඛ්‍ය ඉතිහාසය, අධ්‍යාපනය, රැකියාව සහ ආදායම වැනි ජීවිත සිදුවීම් භාවිතා කරමින් පුද්ගලයෙකුගේ පෞරුෂත්වය, ජීවිත ආයු කාලය හා පුද්ගලයෙකුගේ මරණ සම්භාවිතාව දක්වා පුරෝකථනය කරයි. Life2vec නම් AI මෙවලම නිර්මාණය කර ඇත්තේ OpenAI's ChatGPT වැනි විශාල භාෂා ආකෘති බලගන්වන ට්‍රාන්ස්ෆෝමර් මාදිලි භාවිතා කරමිනි. මෙම මෙවලම ඩෙන්මාර්කයේ සමස්ත ජනගහනයෙන් ලබාගත් දත්ත කට්ටලයක් මත පුහුණු කර ඇත.

### සැඟව ගිය අවුරුදු පන්සීයක් පරණ රන් නැවක් මතුවෙයි



Bom Jesus පෘතුගීසි නැව මීට අවුරුදු පන්සියයකට පමණ පෙර 1533 මාර්තු 07 වැනි සිකුරාදා ඉන්දියාවේ සිට පෘතුගාලයේ ලිස්බන් නුවර බලා යාමේදී රන් සහ තඹ වැනි නිධන් වස්තු පටවාගත් මෙම නැව මුහුදුබත් වී තිබිණි.

පුරාවස්තු පර්යේෂකයන් පවසන්නේ සුන්බුන්ව ගිය Bom Jesus නැව මෑතකාලයේ කළ පුරාවිද්‍යාත්මක සොයාගැනීම්වලින් විශාලතම වටිනාකමක් සහිත එකක් වන බවයි.

මේ වන විට එය නැමිබියානු රජයේ කෞතුකාගාරයක තැන්පත් කර ඇති බවත්, දැඩි ආරක්ෂක විධිවිධාන මත තබා ඇති බවත් CNN නිවුස් අනාවරණය කරයි.

### කම්පන අණු භාවිතය පිළිකා සෛලවලින් 99%ක් විනාශ කරයි



විද්‍යාඥයින් පිළිකා සෛල විනාශ කිරීමට නව ක්‍රමයක් සොයාගෙන ඇත. අධෝරක්ත කිරණ සහිත ඇමයිනොසියානීන් අණු උත්තේජනය කිරීම නිසා ඒවා කම්පනය වී පිළිකා සෛලවල පටල කැඩීම සිදු කරයි. අධෝරක්ත කිරණ භාවිතය වැදගත් වන්නේ එය විද්‍යාඥයින්ට ශරීරයේ ගැඹුරට යාමට හැකි වන බැවිනි. මෙම නව සොයා ගැනීම හේතුවෙන් අස්ථිවල සහ ඉන්ද්‍රියවල පිළිකා ශල්‍යකර්මයකින් තොරව ප්‍රතිකාර කළ හැකිය.


# ජනාධිපතිවරණයද? මහ මැතිවරණයද?

ප්‍රසුගිය දෙසැම්බර් 24වන ඉරිදා සති අන්ත ජාතික පුවත්පතක මුල් පිටුවේ පළවූ ප්‍රධාන පුවතක් රට තුළ විශාල අවධානයක් දිනා ගැනීමට සමත් විය. එම පුවතේ ශීර්ෂ පාඨය වූයේ "නැගී එන පක්ෂයක් කරටි කඩන් එයි" යනුවෙනි. රජයේ බුද්ධි අංශ ආණ්ඩුවට කළ අවධාරණයක් උපුටා දක්වමින් පළවූ එම ප්‍රවෘත්තියේ අදාළ පක්ෂයේ නම සඳහන්ව නොතිබුණද ඒ මාලිමාව බව කාටත් වැටහී තිබුණි. ඉන් ආණ්ඩුවට පරාජය පිළිබඳ අනතුරු හැඟවීමක් තිබුණද ඒ තුළ මාලිමාවේ ජයග්‍රහණය තවදුරටත් වැළැක්විය නොහැකි එකක් වන බවද ගම්‍ය වී තිබුණි.

මේ අතර සමාජය තුළ තවත් සංවාදයක් මතුවී තිබේ. ඒ 2024 නව වසරේ පවත්වනු ලබන්නේ කුමන ඡන්දයද යන කතා බහය. ලබන වසරේ ප්‍රධාන මැතිවරණ දෙකක් පැවැත්වෙන බව අයවැය විවාදය අතරතුර අවස්ථාවක ජනාධිපතිවරයා විසින්ද ප්‍රකාශ කරනු ලැබීය. එය එසේ බව පැහැදිලිය. මන්ද මෙම වසරේ සැප්තැම්බර් 15ත් ඔක්තෝබර් 15ත් අතර සෙනසුරාදා දිනයක අනිවාර්ය ලෙසම ජනාධිපතිවරණය පැවැත්විය යුතුව තිබේ. එය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අනුව කෙරෙන දෙයක් මිස ජනාධිපතිවරයා හෝ ආණ්ඩුව විසින් ලබාදෙන දෙයක් නොවේ. දැන් නියමිත දිනයට ජනාධිපතිවරණය පැවැත්වීමේ සම්පූර්ණ බලය තිබෙන්නේ මැතිවරණ කොමිසම සතුවය. එබැවින් ජනාධිපතිවරණය අනිවාර්යයෙන් පැවැත්වෙන නිසා එක් මැතිවරණයක් වන්නේ එයය.

එසේනම් අනෙක් මැතිවරණය කුමක්ද? එය පාර්ලිමේන්තු මහා මැතිවරණය වනවාට සැකයක් නැත. මන්ද මෙම සැප්තැම්බර් හා ඔක්තෝබර් අතර පැවැත්වෙන ජනාධිපතිවරණයෙන් මහින්ද රාජපක්ෂ පිල හැර කවුරු දිනුවද එම අලුත් ජනාධිපතිවරයා මේ පාර්ලිමේන්තුව විසුරුවා හැර මහා මැතිවරණයක් පවත්වනු ඇත. දේශපාලනයේ බලවේග පෙළගැසී ඇති ආකාරයට හා මහජන කැමැත්ත ප්‍රකාශ වෙමින් තිබෙන ආකාරයට රාජපක්ෂවරුන්ට ඉදිරි ජනාධිපතිවරණයකදී අපේක්ෂකයෙක් සොයා ගැනීම පවා දුෂ්කර කාර්යයක් වනු ඇත. ඔවුනට ජයග්‍රහණයක් ගැන සිතීමටවත් නොහැක.

ඉදිරි ජනාධිපතිවරණයේදී මාලිමාවේ අපේක්ෂක අනුර දිසානායක සහෝදරයාගේ කිට්ටුවටවත් ආ හැකි ජන ආකර්ෂණයක් හා ජන පදනමක් සහිත කිසිදු නායකයෙක් දැන් ලාංකේය දේශපාලනයේ නැත. ඒ අනුව ඉදිරි ජනාධිපතිවරණයේදී මාලිමාවේ ජයග්‍රහණය ස්ථිරය. එවිට ඉන්පසු මහ මැතිවරණයක් පැවත්වීමද සිදුවන නිසා මෙම වසරේ ප්‍රධාන මැතිවරණ දෙකක් පැවැත්වීමට සිදුවීම දේශපාලන යථාර්ථයකි.



එහෙත් මේ අතර ජනාධිපතිවරණයට පෙර මහ මැතිවරණය පැවැත්වීමේ කතාවක්ද සමාජයේ පැතිරමින් පවතී. සැබැවින්ම මෙම මතය සමාජය තුළ පතුරුවමින් සිටින්නේ රාජපක්ෂ කණ්ඩායමට අයත් මන්ත්‍රීවරුන්ය. ස.ජ.බ. මන්ත්‍රීවරුද මෙම අදහසේ සිටිති. සැබැවින්ම මෙය මතයක් ලෙස සමාජගත කරමින් තිබෙන්නේ එම මන්ත්‍රීවරුන්ගේ කැමැත්තය.

පොහොට්ටුවේ තවමත් රාජපක්ෂ පිල තුළ සිටින මන්ත්‍රීවරුන් හා මේ වන විටත් රනිල් සමග අනියමින් පෙළගැසී ඇති මන්ත්‍රීවරුන් කල්පනා කරන ආකාරයක් තිබේ. පළමුව ජනාධිපතිවරණය පවත්වා පසුව මහ මැතිවරණය පවත්වන තත්වයක් තුළ ඔවුන්ට සිය මන්ත්‍රී ධුර රැකගත නොහැකි බව ඔවුහු දනිති. මාලිමාව ජනාධිපතිවරණයෙන් ජයගෙන ඉන් අනතුරුව මහ මැතිවරණය පවත්වන්නේ යැයි සිතන විට, ජනාධිපතිවරණයෙන් ලැබෙන අන්ත පරාජයෙන් පසු මහ මැතිවරණයෙන් මන්ත්‍රීකමවත් බේරා ගැනීම පහසු නැති බව ඔවුහු දනිති.

එබැවින් ඔවුන් කල්පනා කරන්නේ ජනාධිපතිවරණයට කලින් මහ මැතිවරණය පැවැත්වුවහොත් දැනටමත් තමන් දරන මන්ත්‍රී ධුරය හෝ ඇමති ධුරයේ බලය උපයෝගී කරගෙන ජනාධිපතිවරයාත්, ආණ්ඩුවත් දෙකම ඒ වනවිටත් ඔවුන්ගේ නිසා ඔවුනට ආණ්ඩුවක් පිහිටුවීමට නොහැකි වුවත් අඩු ගණනේ තම මන්ත්‍රී ධුරයවත් රැකගත හැකි යැයි කියාය. මේ නිසා ඔවුන් මහ මැතිවරණය කලින් පැවැත්වීම ප්‍රාර්ථනා කරති. සමහරු මෙම අදහස ජනාධිපතිවරයාට යෝජනා කළ බවටද ප්‍රවෘත්ති පළ විය.

එහෙත් මෙය සිතන තරම් පහසු නොවේ. ජනාධිපතිවරණය ව්‍යවස්ථාවට අනුව අනිවාර්යයෙන් පැවැත්විය යුතු නිසාත්, එහි කාලවකවානු නියමිත නිසාත් ඒ සඳහා කිසිවෙකුට අලුතින් තීරණයක් ගැනීමට දෙයක් නැත. එය ජනාධිපතිවරයාගේ හෝ ආණ්ඩුවේ කැමැත්ත, අකමැත්ත මත තීරණය වන්නේ නැත. එහෙත් මහ මැතිවරණය එසේ නොවේ. ඒ සඳහා ජනාධිපතිවරයා විසින් පාර්ලිමේන්තුව විසුරුවා හළ යුතුය. ඒ පාර්ලිමේන්තුවේ නිල කාලය 2025 දක්වා තිබෙන බැවිනි. එක්කෝ ජනාධිපතිවරයා පාර්ලිමේන්තුව විසුරුවා හළ යුතු අතර, නැති නම් පාර්ලිමේන්තුවේ යෝජනාවක් සම්මත කොට එය ජනාධිපතිවරයාට දැන්විය යුතුය. එබැවින් ජනාධිපතිවරණය සඳහා අලුත් තීරණයක් ගැනීමට දෙයක් නොමැති වුවත් මහ මැතිවරණය සඳහා ජනාධිපතිවරයා තීරණයක් ගෙන එය ක්‍රියාවේ යෙදවිය යුතුය.

> **එක්කෝ ජනාධිපතිවරයා පාර්ලිමේන්තුව විසුරුවා හළ යුතු අතර, නැති නම් පාර්ලිමේන්තුවේ යෝජනාවක් සම්මත කොට එය ජනාධිපතිවරයාට දැන්විය යුතුය. එබැවින් ජනාධිපතිවරණය සඳහා අලුත් තීරණයක් ගැනීමට දෙයක් නොමැති වුවත් මහ මැතිවරණය සඳහා ජනාධිපතිවරයා තීරණයක් ගෙන එය ක්‍රියාවේ යෙදවිය යුතුය.**

එසේම ජනාධිපතිවරණයට පෙර මහ මැතිවරණය පවත්වන්නේ නම් එය ජනාධිපතිවරණ ඡන්දය ආරම්භ වීමට පෙර එනම් ජූලිවලට පෙර පවත්වා අවසන් කළ යුතුය. ඒ නිසා මාර්තු - අප්‍රේල් අතර පාර්ලිමේන්තුව විසුරුවීමට එවිට සිදුවනු ඇත. තවමත් එවැනි සූදානමක් නොපෙනේ.

අනෙක් කරුණ වන්නේ මෙහිදී රනිල් වික්‍රමසිංහ සිතන ආකාරයය. ඔහු තවමත් ඉදිරි ජනාධිපතිවරණයේ තරග වැදීමේ අදහසින් සිටී. ඒ සඳහා ඔහු එක්සත් ජාතික පක්ෂය ගොඩනඟනවා වෙනුවට රාජපක්ෂවරුන්ගේම සහයෝගය ගැනීමට හෝ නැතිනම් අඩු ගණනේ දැනට ඔහු සමග සිටින පොහොට්ටු මන්ත්‍රීවරුන්ගේ සහාය ගැනීමට කල්පනා කරන බව පෙනේ. කලින් මහ මැතිවරණය පවත්වා එ.ජා.ප.යට එකදු මන්ත්‍රීකමක් වත් නොලැබුණහොත් රනිල්ට ජනාධිපතිවරණයට ඉදිරිපත් වීමට පවා නොහැකි වනු ඇත. එසේම ඉක්මන් මහ මැතිවරණයක් පැවැත්වූවිට ස්ථිර ලෙසම පොහොට්ටුවේ මන්ත්‍රී සංඛ්‍යාව විශාල වශයෙන් අඩුවන නිසා රනිල් පොහොට්ටුවේ සහාය ගැනීමට සිතන්නේ නම් ඔහුට සහාය දක්වන මන්ත්‍රී පිරිස අඩුවෙනු ඇත. මහ මැතිවරණයෙන් ප්‍රතිඵලය රනිල්ට වාසිදායක නොවන නිසා දැනට පවතින පාර්ලිමේන්තු බලයම යොදාගෙන ජනාධිපතිවරණයට ඉදිරිපත් වීමට රනිල් කැමති වෙනු ඇත. එහිදී රාජපක්ෂවරු තමන්ගේම අපේක්ෂකයෙක් ඉදිරිපත් කළත්, පොහොට්ටුවේ පිරිසකගේ සහාය ලබා ගැනීමට හැකි යැයි රනිල් සිතනු ඇත.

මේ සියලු සාධක කිරා මැන බලනවිට පෙනී යන්නේ ජනාධිපතිවරණයට පෙර මහ මැතිවරණයක් පැවැත්වීම ඉතාම අඩු සම්භාවිතාවක් සහිත දෙයක් බවය. ජනාධිපතිරණය අනිවාර්යයෙන් පැවැත්වෙන නිසා වැඩිම සම්භාවිතාව ඇත්තේ පළමුව ජනාධිපතිවරණය පැවැත්වීමට බව පෙනේ. එහෙත් සමහර විට දේශපාලනයේ සිදුවන චලනයන් නිසා අහම්බෙන් මහ මැතිවරණය කලින් පැවැත්වීමේ කිසියම් සම්භාවිතාවක් තිබුණද තවමත් කරුණු පෙළගැසී ඇත්තේ ජනාධිපතිවරණය පළමුව පැවැත්වීමට නිසා බලයේ වෙනසක් සිතන සියලු බලවේග ජනාධිපතිවරණයකට සූදානම් වීම වැදගත්ය.



"සුපුරුදු ධනපති සම්බන්ධකම් පිළිබඳ පැරණි රජදහන තුළ සිට කටයුතු කිරීම සරලය, පහසුය. නමුත් අලුත් මාවතක යාමට අපට වුවමනා වී තිබේ. එම මාර්ගයේ යාම සඳහා අප සහ සියලුම ජනතාව කෙරෙහි උසස් මට්ටමක දේශපාලන විඥානයක් හා සංවිධානයක් අවශ්‍යය. ඒ සඳහා වැඩි කාලයක් අවශ්‍ය වන අතර එහිදී වඩාත් බරපතළ වැරදි සිදුවේ. නමුත් වැරදි නොකරන්නේ ප්‍රායෝගික වශයෙන් යමක් කිරීමට ප්‍රයත්න නොදරන අය පමණක් බව අපි කියන්නෙමු''

**ලෙනින්**

**තෝරාගත් කෘති, 8වැනි වෙළුම, 149 පිටුව**

# ගාසා යුද්ධය
# කලාපීය ගැටුමකට හැරෙන ලකුණු



දෙසැම්බර් 26 වන දින ඊශ්‍රායලයේ ආරක්ෂක මාණ්ඩලික ප්‍රධානී හේසි හලෙවි ප්‍රකාශ කළේ හමාස් සංවිධානයට එරෙහි ඔවුන්ගේ යුද්ධය තවත් මාස ගණනාවක් ඉදිරියට ඇදෙනු ඇති බවයි. මේ අනුව නව අවුරුද්ද උදා වෙද්දී පලස්තීනය මත කෙරෙන ඊශ්‍රායල් ප්‍රහාර තවදුරටත් පවතිනු ඇති අතර සටන් විරාමයක් පිළිබඳවද නිශ්චිත අදහසක් ප්‍රකාශ කළ නොහැකි තත්වයක් මතුවී තිබේ.

දෙසැම්බර් 27 වන දින ඊශ්‍රායල ආක්‍රමණික හමුදා දකුණු ගාසාහි අල් අමාල් රෝහල වෙත එල්ල කළ ප්‍රහාරයෙන් පුද්ගලයන් තිස් එක් දෙනෙකු ඝාතනය වූ අතර විසි දෙනෙකු පමණ තුවාල ලැබීය. ඊට පසු දින ආක්‍රමණික ඊශ්‍රායල් හමුදා රතු අඩසඳ සංගමයේ මූලස්ථාන ගොඩනැගිලි වෙත පහර දුන්හ.

ඊශ්‍රායල් ආක්‍රමණික හමුදා උතුරු ගාසා ප්‍රදේශයේදීත් මෙයම සිදුකළ අතර එමගින් රෝගීන් හා තුවාල ලැබූවන්ට රෝහල් වෙත ළඟාවීමටත් ප්‍රතිකාර ලබා ගැනීමට තිබෙන අවස්ථාත් අහිමි කරලීය.

ගාසා තීරයේ අනෙකුත් රෝහල් මෙන් අල් අමාල් රෝහලද ඊශ්‍රායල ප්‍රහාරවලින් අවතැන් වූ දහස් ගණනක් පලස්තීන ජාතිකයන්ට රැකවරණ ලබාදී තිබුණි. පසුගිය සති කිහිපය තුළ පමණක් 14,000 ක පමණ ජනතාවකට එහි රැකවරණ ලබාදී තිබුණි. ගාසාහි විශාලතම රෝහල වන අල් ශියා රෝහල අවතැන් වූ පුද්ගලයින් 50,000කට පමණ රැකවරණය ලබා දෙමින් සිටී.

ලෝක සෞඛ්‍ය සංවිධානයට අනුව ගාසා තීරයේ රෝහල්වල පවත්නා තත්වය ඉතාම ඛේදජනකය. රෝගීන්ගේ අවශ්‍යතාවට සාපේක්ෂව ගාසාහි රෝහල් පද්ධතියට සැපයිය හැකි ප්‍රතිකාර ඉතාම අවම මට්ටමක පවතී. බොහෝ රෝහල්වල ප්‍රතිකාර සඳහා අවශ්‍ය ඖෂධ, වෛද්‍ය උපකරණ හිඟය. රෝහල් වෙත එන බොහෝ රෝගීන් රෝහල් වෙත ළඟා වන්නේ සති කිහිපයකට පෙර ලැබූ තුවාල සහිතවය. ඒවා ඒ වන විටත් විෂබීජවලින් ආසාදිතව ඇති අතර ඔවුන් මරණයෙන් බේරා ගැනීමට නම් අත් පා කපා දැමීම හැර වෙනත් විකල්පයක් නැති වී තිබේ.

මීට අමතරව ගාසා තීරය තුළ උග්‍ර සෞඛ්‍ය සේවක හිඟයක්ද පවතී. දැනටමත් එහි සේවය කරන සෞඛ්‍ය සේවකයින් උපරිම වෙහෙසකට පත් වී ඇති අතර ඔවුහු යුද කම්පනයෙන්ද පෙළෙති. වෛද්‍යවරු හා හෙදියන් ඔවුන්ගේ උපරිමයෙන් සේවයේ යෙදුණද සටන් විරාම තත්වයක් ඇති වනතුරු ඔවුන්ගේ හොඳම සේවාව ලබාදීම අපහසු වී ඇත.

තවද ඊශ්‍රායල් ආක්‍රමණික හමුදා පලස්තීන සෞඛ්‍ය සේවකයින් අතුරුදහන් කරමින් සිටී. අල් අව්ඩා ජබල්යා රෝහලේ අධ්‍යක්ෂ අහමඩ් මුහන්නා ඇතුළු රෝහල් කාර්ය මණ්ඩලයේ දොළොස් දෙනෙකු මේ වන විට ඊශ්‍රායල් ආක්‍රමණික හමුදාව විසින් අතුරුදහන් කරනු ලැබ තිබේ. ඔවුන් වහාම නිදහස් කරන ලෙස ජාත්‍යන්තර ආයාචනයන් සිදුකළද මේ වනතුරුත් ඔවුන් සිටිනා ස්ථානයක් සොයා ගත නොහැකිය.


සෞඛ්‍ය යටිතල පහසුකම්වල හිඟතාවට අමතරව ගාසා තීරය තුළ ජනතාවට ජීවත්වීම සඳහා ස්ථානයන්ද බරපතළ හිඟයක පවතී. පුද්ගලයින් දාහකට පමණ නවාතැන් සැපයිය හැකි ඛාන් යුනිස් පුහුණු මධ්‍යස්ථානය තුළ මේ වන විට තිස්දාහක් පමණ රැකවරණය ලබති. එක්සත් ජාතීන්ගේ සංවිධානයට අනුව යුදමය අවස්ථාවකදී පුද්ගලයින් විස්සකට අවම වශයෙන් වැසිකිළියක් තිබිය යුතු වුවද එහි ඇත්තේ පුද්ගලයින් හාරසියයකට එක් වැසිකිළියක් පමණි. අනෙකුත් මධ්‍යස්ථානවල තත්වයද එසේමය. මේ නිසා සෞඛ්‍ය විශේෂඥයින් අනතුරු අඟවා ඇත්තේ ඉදිරියේදී ඊශ්‍රායල ප්‍රහාරවලින් මිය යන අයට වඩා වැඩි පිරිසක් බෝවන රෝගවලින් මිය යාමට ඉඩ ඇති බවය. ඊශ්‍රායල් ප්‍රහාර ආරම්භ වූ ඔක්තෝබර් මාසයෙන් පසුව පමණක් ගාසා තීරය තුළ පාචන රෝගීන් ලක්ෂයක් පමණ, ස්වසන ආබාධ සහිත රෝගීන් එක් ලක්ෂ පනස්දාහක් පමණක් වාර්තා වී ඇත. මීට අමතරව පැපොල, මොළේ උණ සහ පරපෝෂිත ආසාදිතයන් විශාල ප්‍රමාණයක් වාර්තා වෙමින් තිබේ.

මේ අතර දේශපාලන විචාරකයෙන් ප්‍රකාශ කර සිටින්නේ මෙම යුදමය තත්වය දිගු කාලයක් පවත්වාගෙන යාම ඊශ්‍රායලයටද අවාසි සහගත බවයි. මේ වන විට ඊශ්‍රායලයේ මෙම ප්‍රහාර වහා නවතා දමන ලෙසටත් සටන් විරාමයකට එළඹෙන ලෙසටත් දැවැන්ත ජාත්‍යන්තර බලපෑමක් ඇති වී තිබේ.

Financial Times පුවත්පත වාර්තා කළේ ඉරානය සමඟ ගැටුම් උත්සන්න වීමත් සමග මෙම අර්බුදය කලාපීය අර්බුදයක් දක්වා වර්ධනය විය හැකි බවය. මේ වන විට ඊශ්‍රායලය පැති හතකින් ප්‍රහාරයට ලක් වීමේ අනතුරකට මුහුණපා සිටී. එනම් ගාසා තීරය තුළින්, බටහිර ඉවුරෙන්, ලෙබනනයෙන්, සිරියාවෙන්, ඉරාකයෙන්, යේමනයෙන් සහ ඉරානයෙන් ආදී වශයෙනි.

මේ පසුබිම තුළ එක්සත් ජනපදය හා ඊශ්‍රායලය මෙම ගැටුම ඉරානය හා ඉරානයට සහයෝගය දක්වන කණ්ඩායම් සමග සටනකට හැරවීමටද ඉඩ තිබේ.

## චීනය/රුසියාවඃ තොරතුරු සොරා ගැනීමට වැට බැඳ



චීනය හා රුසියාව තොරතුරු හා දත්ත සොරා ගත නොහැකි (Hack Proof) සන්නිවේදන ක්‍රමයක් සාර්ථකව අත්හදා බලා තිබේ. මෙම දෙරට මෝසි චන්ද්‍රිකාව මගින් ආරක්ෂිත යතුරු සහිත ක්වොන්ටම් සන්නිවේදන ක්‍රමවේදයක් යොදාගෙන තිබේ. ඉදිරියේදී මෙම සන්නිවේදන ක්‍රමවේදය BRICS රටවල් අතර සන්නිවේදන කටයුතු සඳහා හඳුන්වා දීමට ඔවුන් තීරණය කර තිබේ.

## එක්සත් ජනපදයඃ ඩොලරයේ පසුබැසීම අත්දකිමින්



ජාත්‍යන්තර මූල්‍ය අරමුදල විසින් නිකුත් කර ඇති නවතම තොරතුරුවලට අනුව ලෝකයේ මහ බැංකු සංචිතවල එක්සත් ජනපද ඩොලරයේ කොටස 2023 වසරේ තුන්වන කාර්තුවේදී 59.2% දක්වා තවදුරටත් පහත වැටී තිබේ. 2000 වසරේදී එහි කොටස දළ වශයෙන් 70% ක් විය.

ලෝකයේ මහ බැංකු සංචිතවලින් දෙවැනියට විශාලතම කොටස දැරුවේ යුරෝවයි. ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ වාර්තාවලට අනුව එහි කොටසද 19.6% දක්වා පහත වැටී තිබේ.

## බෙල්ජියමඃ සහන කපන යුරෝපා නායකයින්ට විරෝධය පා



පසුගිය දෙසැම්බර් 12වැනි දා යුරෝපා සංගමය විසින් හඳුන්වා දී ඇති කප්පාදු වැඩපිළිවෙලට එරෙහිව රටවල් තිහක පමණ වෘත්තීය සමිති සාමාජිකයන්, දේශපාලන පක්ෂ නියෝජිතයින් හා අනෙකුත් වැඩ කරන කම්කරු පංතික කොටස් බෙල්ජියමේ බ්‍රසල්ස් අගනගරයේදී විරෝධතාවක යෙදුණි. ඊට පහළොස් දාහක පමණ පිරිසක් සහභාගි වී සිට ඇති අතර දෙසැම්බර් මස 14 /15 දෙදින බ්‍රසල්ස්හිදී පැවැත්වීමට නියමිතව තිබූ යුරෝපා සංගමයේ නායකයන්ගේ සමුළුවට සමාන්තරව මෙම විරෝධතාව සංවිධානය කර තිබුණි.

## ආජන්ටිනාවඃ කම්කරු පනතට එරෙහිව ජනතාව පාරට




ආජන්ටිනාවේ නව දක්ෂිණාංශික ජනාධිපති ජේවියර් මිලේ විසින් හඳුන්වා දුන් නව කම්කරු පනතට එරෙහිව දෙසැම්බර් 20 වන දින බුවර්නෝස් අයර්හි දහස් ගණනක් ජනතාව විරෝධතාවක යෙදුණි. 'හදිසි හා අවශ්‍යතා පනත' නම් වූ එමගින් අවශ්‍ය අවස්ථාවක රජයේ සේවකයන් සේවයෙන් පහ කිරීමට අවශ්‍ය තත්වයන් සකසා තිබේ. ඊට අමතරව රාජ්‍ය ව්‍යාපාර පුද්ගලිකකරණය, කම්කරුවන්ගේ මාතෘ නිවාඩු ලැබීමේ අයිතිය ඇතුළු අයිතීන් කප්පාදු කිරීම, අපනයන සීමාවන් ඉවත් කිරීම, නිවාස කුලී නීතිය වෙනස් කිරීම, ඉඩම් හිමිකාරීත්වය පිළිබඳව නීති වෙනස් කිරීම ආදී ජනතා විරෝධී ක්‍රියාමාර්ග රැසකට ඉන් ඉඩකඩ ලබා දී තිබේ.

# 2024: අන්ධකාර ආර්ථිකයෙන් අපේක්ෂාවේ මඟට පිවිසේද?

2023 වසරද ගෙවී ගියේ සුපුරුදු ලෙසම ලංකාව අඳුරු ආර්ථික පීඩනයේ අත්දැකීම් තුළම තවදුරටත් තබමින්ය. ජනතාවගේ නත්තල් සැනසුමද නව වසරේ ආරම්භයද උදුරා ගනු ලැබිණි. කිරිබතකට ලූනු සම්බෝලයක් අහිමි කළ ජනවාරි පළවෙනිදාවක් බොහෝ නිවෙස්වල උදෑසන විය. 2023 ජනවාරි පළවෙනිදා රුපියල් 70ට මිලදී ගත් ලූනු කිලෝවක් 2023 දෙසැම්බර් 25 මිලදී ගැනීමට සිදුවූයේ රු. 660කටය. ඒ, එක් උදාහරණයක් පමණි.

2024 එළඹ ඇත්තේ 18%ක වැට් කරුමයක් භාණ්ඩ රැසකට පනවමිනි. තමන්ට බදු පැනවෙන භාණ්ඩ මොනවාදැයි අඩුතරමින් දැනගැනීමට අයිතියක් ඇති බව ජනතාව දන්නේ නැත. ඒ මදිවාට අයකරන බදු මතටද බදු පනවන සූරාකෑමකින් 2024 නව වසර පිළිගැනීමට ශ්‍රී ලංකාවේ ජනතාවට සිදුව තිබේ.

## කඩා වැටීමෙ තරම

ලෝකයේ දරුණුවටම කඩා වැටුණු ආර්ථිකයන් අතර ඉදිරියේම ස්ථානයක් 2023 වසරදීත් 'රැක ගැනීමට' වික්‍රමසිංහ-රාජපක්ෂ හවුල් පාලනය 2023 වසරේදීත් 'සාර්ථක' ලෙස සමත් විය. පහත ණය ගැති බවේ සටහන ඒ බවට සාක්ෂි දරයි. ණය පොලී ගෙවීම අතින් ලංකාව දෙවැනි වන්නේ ඊජිප්තුවට පමණි. දළ දේශීය නිෂ්පාදිතයෙන් ප්‍රතිශතයක් ලෙස 8.49%ක අගයක් ලංකාව ණයවල පොලියට ගෙවයි. ඊජිප්තුවේ එම අගය 12.2%කි. ණයවීම අතින් සැම්බියාව දළ දේශීය නිෂ්පාදිතයෙන් 101% ක් වන විට ලංකාව 106%කි. (ප්‍රස්ථාරය 01)

## විදේශ ආයෝජන

ශ්‍රී ලංකාව මේ මොහොතේ මුහුණ දෙන ප්‍රධානම අර්බුදය වී ඇත්තේ විදේශ විනිමය ගැටලුව බව නොරහසකි. ඊළඟට ප්‍රධානම ප්‍රශ්නය නිෂ්පාදන පංගුව පුළුල් නොවී ආර්ථිකය හැකිළීමේ වේගය වැඩිවීමයි. ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ දෙවන වාරිකය ලැබීමේ ප්‍රීතියෙන් ප්‍රමෝදයට පත්ව සිටින රනිල්-රාජපක්ෂ පාලනයට විදේශ ආයෝජන මගින් හෝ අපනයන ඉහළ නැංවීමෙන් ආර්ථිකයේ පංගුව පුළුල් කිරීමට කිසිදු දායකවීමක් කරගත නොහැකි වසරක් ලෙස 2023 වසරද ගත විය.



"ඔබ ප්‍රතිපත්තිගරුක විය යුතුයි. ජනතාව සඳහා ප්‍රතිපත්ති සේම ඔබේ සතුරන් සඳහා ප්‍රතිපත්තිද ඔබට තිබිය යුතුයි. නැතිනම් ඔබට ජය ගත නොහැකියි."

**ෆිදෙල් කස්ත්‍රෝ**

ආණ්ඩුව 2023 වසරේ පළමු මාස 09 තුළ මාසිකව ඩොලර් මිලියන 400කට අඩු අගයකින් වෙළඳ ශේෂ පරතරය නඩත්තු කර ගැනීමට උත්සාහ කළද පසුගිය ඔක්තෝම්බර් මාසයේදී එම පරතරය ඩොලර් මිලියන 682ක් දක්වා ඉහළ ගියේය. එයට ප්‍රධාන හේතුව වූයේ අපනයන ආදායම් 11%කින් කඩා වැටෙන අතර ආනයන වියදම 14% කින් එම මාසයේදී ඉහළ යාමයි.

## ඇඟලුම් අර්බුදය

අපගේ අපනයන ආදායම අතර විශාලම දායකත්වයක් සපයන ඇඟලුම් නිෂ්පාදන අපනයනයන් 20%කින් පමණ කඩා වැටී ඇත. ඇඟලුම්වලින් 86%ක්ම යුරෝපයට සහ ඇමෙරිකා එක්සත් ජනපදයට වන අතර පසුගිය වසරේ මෙම කලාප දෙකෙහිම අපනයනයන් පිළිවෙලින් 18% (Europe) හා 25% (USA) ලෙස කඩා වැටුණි. අධික විදුලි වියදම නිසා ලංකාවේ අපනයනවල මිල ඉහළ යාම මෙම බිඳ වැටීමට ප්‍රධාන හේතුවක් වී ඇති බව පැවසේ.




## අක්‍රීය ණය අර්බුදය

පසුගිය වසරේ ලංකාවේ බොහෝ කර්මාන්ත, ව්‍යාපාර, බැංකු ණය උගුලක හිරවුණු බව නොරහසකි. පසුගිය වසරේ පමණක් ලංකාවේ බැංකු පද්ධතියේ අක්‍රීය ණය අනුපාතය (NPL) 13% සිට 30% දක්වා ඉහළ ගොස් ඇත. එය බැංකුවලට අර්බුදයක් මෙන්ම ව්‍යාපාර කර්මාන්ත ක්ෂේත්‍රයේ අර්බුදයේ තරම පෙන්වන පැතිකඩකි. මෙම ණය ගෙවා ගැනීමට නොහැකි වීමේ අර්බුදයට වැඩිපුරම මුහුණ දී ඇත්තේ හෝටල්, ප්‍රවාහන හා විනෝදාස්වාද සැපයීමේ ව්‍යාපාරවල නියුතු වූවන්ය.

ගෝඨාභයගේ සහරාන් බෝම්බ ප්‍රහාරයෙන්ද, කොවිඩ් වසංගතයෙන්ද දැඩිම පීඩාවට පත් ක්ෂේත්‍රයකි, සංචාරක කරමාන්තය. විදේශ සංචාරකයින් පැමිණීම මුළුමනින්ම කඩා වැටුණු අතර, දේශීය සංචාරකයින්ගේ වියදම් කිරීමේ සීමාවීම නිසා එම සංචාරක ආයතන සේවක පිරිස් නඩත්තු කිරීමේ සිටම ඉතා දැඩි අපහසුතාවයකට සංචාරක ව්‍යාපාරය මුහුණදී සිටී. දැනට මාස 11ක් තුළදී (2023) ශ්‍රී ලංකාවේ සංචාරක කර්මාන්තය ඉපැයීම වී ඇත්තේ ඩොලර් මිලියන 118ක් පමණි. එය 2018 වසර හා සැසඳීමේදී හරි අඩකටත් අඩු ආදායමකි. සාමාන්‍යයෙන් වසරකට ඩොලර් බිලියන 4-5ක ආදායම් උපයන සංචාරක කර්මාන්තයේ වත්මන් බිඳ වැටීමේ තරම මේ අනුව තේරුම් ගත හැකිය.

ලීසිං (කල්බදු) සමාගම්වල ණය අක්‍රීය වීමේ අනුපාතය පමණක් ගිය වසරේදී 65%කි. එම ක්ෂේත්‍රයේ අවිධිමත් මූල්‍ය සමාගම් විශාල ප්‍රමාණයකට තමන් දුන් ණය අයකර ගත නොහැකි වූ අතර එම ලීසිං සමාගම්වල ඉහළ පොලී අපේක්ෂාවෙන් මුදල් තැන්පත් කළ බොහෝ දෙනෙක් තමන්ට ඉහළ පොලී කෙසේ වෙතත්, යෙදූ මූලික තැන්පතු මුදල්වත් ලබා ගැනීමට නොහැකි අර්බුදයකට දැන් පත්ව සිටිති.

## ඉදිකිරීම් බිඳ වැටීම

ඉදිකිරීම් කර්මාන්තය සෘජු ලෙසම දළ දේශීය නිෂ්පාදිතයට 12%ක පමණ දායකත්වයක් සපයයි. ඊට අමතරව වක්‍ර ලෙස පවුල් දහස් ගණනකගේ ජීවන වෘත්තීන්ට දායක වෙයි. රජය ලංකාවේ ඉදිකිරීම් ක්ෂේත්‍රයේ විශාලම වියදම් කරන්නාය. පසුගිය වසර කිහිපය පුරාම ඇතිවූ ආර්ථික කඩා වැටීමේ ප්‍රතිඵල සෘජු ලෙසම ඉදිකිරීම් ක්ෂේත්‍රයට බලපෑ අතර ඒ නිසා රැකියා අහිමි වූවෝ ලක්ෂ ගණනකි. 2022 වසරේද මෙම ක්ෂේත්‍රයේ අර්බුදය උග්‍ර වූ අතර 2023 දී අඩුතරමේ 2022 මට්ටමටවත් ළඟා වීමට බැරි තරමට ඉදිකිරීම් ක්ෂෙත්‍රයද බිඳ වැටුණි. 2022ට සාපේක්ෂව 2023 දී ඉදිකිරීම් ක්ෂේත්‍රයේ වර්ධනය බිඳ වැටීම 5.5%කි.

| වර්ගය | වසර | | 2023 තුන්වන කාර්තුව | |
|---|---|---|---|---|
| | 2021 | 2022 | 2022 Q2 | 2023 Q3 |
| කෘෂිකර්මය | 0.9 | (4.6) | (6.7) | 3.0 |
| කර්මාන්ත | 5.7 | (16.0) | (21.3) | 0.3 |
| සේවා | 3.5 | (7.0) | (4.2) | 1.3 |
| නිෂ්පාදන මත බදු සහනාධාර | (3.6) | (27.1) | (38.7) | (13.6) |
| (G.D.P.) දළ දේශීය නිෂ්පාදිතය | 3.5 | (7.8) | (11.5) | 1.6 |

| | වසර - ඩො. මිලියන | |
|---|---|---|
| | 2022 | 2023 |
| අපනයන | 11043 | 9909 |
| කාෂිකර්ම | 2165 | 2145 |
| කර්මාන්ත | 8832 | 7721 |
| ඛනිජ | 27 | 20 |
| වර්ගීකරණය නොකළ | 18.5 | 23 |

## ක්‍රෙඩිට් කාඩ් අත්හැරීම


මැද පංතියේ මේ අර්බුදය තේරුම් ගැනීමට ගිය වසරට වඩා මේ වසරේ ණයපත් (ක්‍රෙඩිට් කාඩ්) භාවිතය අත්හළ පිරිස ගණනය කිරීම ප්‍රමාණවත්ය. 2022 දෙසැම්බර් වන විට සම්පූර්ණ ක්‍රියාකාරී ක්‍රෙඩිට් කාඩ් (Credit Card) ප්‍රමාණය 1,952,991ක් විය. එය 2023 සැප්තැම්බර් වන විට 1,915,559ත් දක්වා අඩුවී ඇත. අක්‍රීය වී ඇති ක්‍රෙඩිට් කාඩ් හිමියන්ගේ ප්‍රමාණය 37,432කි. ඒ ගතවූ මාස 09කටය. ඒ අනුව මාසයකට 4000කට වැඩි පිරිසකගේ ණය පත් අක්‍රීය වී ඇත. ආර්ථිකය හැකිළීමේ තරම තේරුම් ගැනීමට මෙයද දර්ශකයකි.

ජීවත්වීම වෙනුවෙන් රටින් පැනයාම තෝරා ගන්න බලකරනු ලැබ ඇති ජනතාවකට විදුලි බිලේ සිට ඩීසල්, පෙට්‍රල්, ගෑස් ඇතුළු සියලු දේටම අදාළ වන එදිනෙදා පරිභෝජනය කරන භාණ්ඩ රැසකට 18%ක් අලුතින්ම සහ දැනට 15%ක් අයකළ භාණ්ඩ සඳහා 18% ලෙසද වැට් බදු අයකිරීමට නියමිතය.


ඊට අමතරව බදු දැලට හසුවන පිරිස් වැඩි කිරීම සඳහා බද්දෙන් නිදහස් පිරිවැටුම් සීමාව වසරක මිලියන 80 සිට මිලියන 60 දක්වා අඩු කරනු ලැබීය. ඒ අනුව මාසයකට රුපියල් ලක්ෂ 50ක වෙළඳාමක් ඇති සෑම ව්‍යාපාරිකයෙක්ම වැට් ගෙවීමට අදාළ කර ගනී.

2022 දෙවැනි, තුන්වැනි කාර්තුවලට සාපේක්ෂව 2023 දෙවැනි ($Q_2$) හා තුන්වැනි ($Q_3$) කාර්තුවල ආර්ථිකයේ හැකිළීමේ ප්‍රමාණය සාධනීය තත්වයක් පැවැතියද මෙම වසරේද දළ දෙශීය නිෂ්පාදනය වර්ධනය වීමේ සෘණ මට්ටම උග්‍ර ලෙසම දැකිය හැකිය.

2024 ජනතාව තවදුරටත් අර්බුදයේ වසරක් ලෙසම බාර ගන්නේද, නැතහොත් අලුත් අපේක්ෂාවන් පෙරදැරි කරන අපේක්ෂාවේ වසර ලෙසට පිළිගන්නේද යන්න තීරණය කළ යුත්තේ ජනතාවමය.




(ප්‍රස්ථාරය 01)



# “ගැහැනු එක මිටට” සිටිය යුත්තේ ඇයි?

අපි සෞභාග්‍යයේ හා සශ්‍රීකත්වයේ සුබ ලකුණු මතින්, ලබන්නා වූ අලුත් අවුරුද්දම කිරියෙන් පැණියෙන් උතුරා යනු ඇතැයි බලාපොරොත්තුවෙන් සෑම වසරකම ජනවාරි පළවෙනිදා කිරිබත් ඉවූ ගැහැනු වෙමු.

නමුත් මෑත කාලීන ඉතිහාසය තුළ කිරිබත් යන නම ඇසෙන විටත් අපට දැනෙන්නේ අප්‍රුලකි. එයට හේතුව වන්නේ රැවටීමේ හා ගොනාට ඇන්දවීමෙ සියලු කටයුතු ආරම්භ වූයේ රතිඤ්ඤා පත්තු කර කිරිබත් ඉවීම හේතුවෙනි. අනෙක් අතට දැන් කිරිබත් තියා එදා වේල පිරිමහ ගන්නට වත් නොහැකි තරමට අපව පෙළා දමමින් හිඳින මොහොතක සෑම වසරකම ජනවාරි පළමුවනදා කිරිබත් ඉව්වත් කිරියෙන් පැණියෙන් උතුරා ගියේ නැති බව අවබෝධ වී තිබේ. අවසානයේ අපට උරුම වූයේ දුක, කඳුළු, සුසුම, වේදනාව, බඩගින්න, මන්දපෝෂණය, දරිද්‍රතාවය සහ උසුලා ගත නොහැකි බදු බර හා ණය බර පමණකි.

ජීව විද්‍යාත්මකවම කාන්තාවන් සියලු දුක්ඛ දෝමනස්සයන් ගැන සිතන, පසුතැවිලි වෙන, වේදනා විඳින, කඳුළු සලන, සුසුම් හෙලන සහ තමන්ට බලපාන ඕනෑම අභියෝගයකට එරෙහි වීමට තරම් ශක්තියක් ඇති ජීවීන් කොටසකි. ලංකාවේ ගැහැනුන් මේ වන විට ඇති තරම් වේදනාවන් විඳ, සුසුම් කඳුළු සලා අන්ත අසරණ භාවයට පත්ව ඇත. දැන් කාන්තාවන් වන අපට ඉතිරිව ඇත්තේ ජනවාරි පළවෙනිදාට අලුත් කිරිබතක් උයා සැනසෙනවාට වඩා එහා ගිය දිගු කාලීන විසඳුම් සෙවීමේ අරමුණින් ඒ සඳහා අලුතින් සිතා කටයුතු කිරීමයි.

රනිල් - රාජපක්ෂ ආණ්ඩුව ජනවාරි මාසයේ සිට ලංකාවේ කාන්තාවන් කබලෙන් ලිපට වට්ටන අයවැයක් ඉදිරිපත් කළ බව අපි දුටුවෙමු. ඒ අනුව 2024 නව වසරත් සමගම අපට උදාවන්නේ බදු බරින් මිරිකෙන වසරකි. මේ ජනවාරි මස සිට වැට් බදු 18% දක්වා වැඩි කිරීමට අයවැයෙන් යෝජනා වී තිබුණේය. එ අනුව මෙතෙක් 15% ව තිබුණු වැට් බද්ද තවත් 3%කින් ඉහළ යයි. එපමණක් නොව මෙතෙක් බදු පනවා නොතිබුණු භාණ්ඩ 97ට අලුතින් වැට් අය කරනු ලබයි. මේ අලුතින් වැට් බදු පනවන භාණ්ඩ අතර අප එදිනෙදා පරිහරණය කරන අත්‍යාවශ්‍ය භාණ්ඩ බොහොමයක් ඇත. ඒ අනුව අපේ ජීවිත තව තවත් ඛේදනීය වන බවට සලකුණු දැන් සිටම පෙනෙන්නට තිබේ.

බදු 18%ක් වන්නේ එක් භාණ්ඩයක් සඳහා පමණි. එය නිෂ්පාදනය කරන්නට අවශ්‍ය අනෙකුත් අමුද්‍රව්‍ය සඳහා ද බදු පැනවූ විට තවත් වටයකින් හාල්, එළවළු, සීනි, පිටි ආදී ආහාර ද්‍රව්‍ය මිලද ඉහළ යනු ඇත.

දැන් ලංකාවේ කුස්සිවල ඉදෙන බත වූ කලී පෝෂණයෙන් සපිරි බතක් නොව යාන්තම් දිවි ගැටගහ ගන්නට තරම් වූ දුප්පත් බත් වේලකි. අලුත් බදු පනතින් ආණ්ඩුව පහර ගසා ඇත්තේ ජනතාවගේ බත් පතටය. මේ බත් පත පිඟානට ගෙනෙන්නට මව්වරුන් විඳිනා දුක ආණ්ඩුවට වගක් නැත. ජනාධිපතිගේ පටන් රට අගාධයට ඇද දැමූ සියලු මැති ඇමතිලා භුක්ති විඳින්නේ අපෙන් උදුරා ගන්නා බත් පතයි.

ඉන්ධන හා ගෑස් මිල ඉහළ යාම හේතුවෙන් සියලුම භාණ්ඩවල මිල ඉහළ යයි. ආහාර ද්‍රව්‍ය, ගෘහ උපකරණ, විදුලි උපකරණ පමණක් නොව ඇඳුම් පැළඳුම් පවා අධික ලෙස මිල වැඩිවෙනු ඇත. පෙබරවාරි සිට ඇරඹෙන නව පාසල් වාරයේදී නව වැට් එකතු වූ පසුව දරුවන්ට සපත්තු, පාසල් නිල ඇඳුම් මෙන්ම පාසල් උපකරණ මිලදී ගන්නට විශාල වියදමක් දැරීමට දෙමව්පියන්ට සිදුවන වටපිටාවක් තුළ දෙමාපියන් පත්වන අසරණභාවය කෙබඳු නම් විය හැකිද?

එපමණක් නොව අධ්‍යාපන ක්ෂේත්‍රයේ ගුරුවරුන් 40,000ට ආසන්න පිරිසකගේ හිඟයක් ඇත. පාසල් නඩත්තුවට ආණ්ඩුවෙන් මුදල් වෙන් නොකර එය දෙමව්පියන් මත පටවනු ලැබ ඇත. මේ තත්වය අධ්‍යාපනයට පමණක් නොව සමස්ත රටේ අනාගතයටම බලපානු නැතැයි කාට නම් කිව හැකිද?

එසේ දරුවන්ගේ අධ්‍යාපනය ලැබීමේ අයිතිය හැකිළී යද්දී තවත් පැත්තකින් ජනතාවට මෙතෙක් කලක් යම් කිසි සීමාවකට යටත්ව හෝ තිබූ නිදහස් සෞඛ්‍ය සේවයද අහෝසි වී යමින් පවතී.

සැබවින්ම රැවටුණු ඉතිහාසයක් ඇති අපේ හෙට දවස බොහෝ බියකරුය. ඒ බියකරු අනාගතයේ ගොදුරු බවට පත්වන දරුවන් දෙස හැඬූ කඳුළින් බලා සිටින්නට මව්වරුනට සිදුවෙනු ඇත. නොයෙක් සිහින පෙන්වමින් ගැහැනුන්ගේ කඳුළු වෙන්දේසි කරන්නට දේශපාලකයන් ඉදිරියට එනු ඇත.

පාර්ලිමේන්තුවේදී ජනතාව පෙළන අනපනත් අත ඔසවා සම්මත කර, එළියට ඇවිදින් එයට විරුද්ධ බව අඟවා ගැහැනුන් ගොනාට අන්දවනු ඇත.

වසර 75ක් පුරා අපට ඇත්තේ රැවටුණු ඉතිහාසයකි. ජනසවියට හෝ සමෘද්ධියට, වැසිකිළි පෝච්චියට, ගාමන්ට් ෆැක්ටරියක රැකියාවට, මහන මැෂිමට ගැහැනුන් නොරැවටෙන බවත්, හොරුන් දූෂිතයන් රට පාලනයට සුදුස්සන් නොවෙන බවත් ගැහැනු දැන් අවබෝධ කරගෙන ඇති බවට සැකයක් නැත.

එළඹෙන 2024 වර්ෂය කාන්තාවන් වන අපට සුවිශේෂී වසරකි. ජනගහනයෙන් 52%ක් වූ කාන්තාවන් රටේ තීරණාත්මක බලවේගයයි. ලංකාවේ ඡන්ද දායකයින්ගෙන් 56%ක් කාන්තා ඡන්ද දායිකාවන්ය. එසේ නම් කාන්තාවන්ගේ ඡන්දය, පාලකයන් තෝරා ගැනීම විෂයෙහි තීරණාත්මක වෙයි. ඒ තීරණාත්මක තීරණය ගත යුත්තේ බුද්ධිමත්වය. අලුත් අවුරුද්ද අර්ථවත් වන්නේත්, තවත් පරණ ලෙස ගෙවෙන වසරක් නොවන්නේත් එවිටය.

නව වසරේ අලුත් පාලනයක් වෙනුවෙන් “ගැහැනු එක මිටට” සිටිය යුත්තේ එබැවිනි.

## අරුණට මඟ කියන...

වසරක් ගෙවී නව වසරක එළි පත්තේ
සුසුමක් පමණක් ද අද ඉතිරිව ඇත්තේ
කඳුළක් හලා දුක නැත විඳගත යුත්තේ
පොකුරක් වෙලා හැප්පෙමු අපි ඒ මත්තේ

අපුල වෙලා නීරස දිවි ගඟ ගැලුවා
කොපුල තෙමා අපි එහි පීඩා දැරුවා
විපුල බිමක සරු ඇස්වනු ගිනි තැබුවා
තෙපුල මුසා සුළි සුළඟක් වී හැමුවා

අතින් අත එක්ව අත් එක ලෙසකට බැඳුනා
එකින් එක අඳුර මැද වුව තරු කැට දිලුනා
නෙතින් නෙත නවමු පැතුමක් දැළු දැමුනා
පෙළින් පෙළ කටු මතත් ලස්සන මල් පිපුණා

උදෑසනක් ළඟ ළඟ එන බව පෙනෙන
රාත්‍රියකි මේ දැඩි අඳුරක ගෙවන
එකෙක් නොවී අඳුරේ වකුටුව නිදන
කෙනෙක් වෙන්න ඒ අරුණට මඟ කියන

## “අපි නැගිටිමු!”



සමන්මලී ගුණසිංහ
ලේකම් - අයිතීන් උදෙසා කාන්තාවෝ

අම්මත් එක්ක සතුටින් කිරිබතක් කන්න දරුවන්ට නොහැකි වෙලා. දහස් ගණන් අම්මලාට ජීවත්වීම සඳහා දරුවන් තනිකර ඈත රටකට යන්න සිදුවෙලා. රටම ණයකළ පාලකයෝ බදුවලින් ජනතාව හෙම්බත් කරලා. අපට ඉතිරිව ඇත්තේ පාලකයින්ට සොරකම් කර ගත නොහැකි ආත්ම විශ්වාසය හා ධෛර්යය පමණි.

දිනෙන් දින පීඩාවෙන් හෙම්බත් වූ ගැහැනිය අද වන විට රටම විනාශ කළ පාලකයෝ ගැනම කියවන්න පටන් අරන්. ප්‍රශ්න කරන්නට පටන් අරන්. අලුත් මඟකට පෙළගැහෙන්න පටන් අරන්. පාලකයින්ට විනාශ කළ නොහැකි වූ ගැහැනියගේ ශක්තිය හා ධෛර්යයෙන්ම යෝධ පවුරක් ලෙස ශක්තිමත්ව වර්ධනය වෙනවා. එම ධෛර්යයෙන්ම සමාජයේ අලුතින් කියවන ගැහැනිය සමාජයට මඟ කියන ගමන ආරම්භ කරලා. සියල්ල අහිමි ලොව තුළ අලුත් අවුරුද්දේ සියලු ගැහැනුන් අලුත් රටක් ගොඩ නඟන්න එක පෙළට පෙළගැස්සෙනවා. ජනතාවට හිමි සියලු දේවල් භුක්ති විඳිමින් හැත්ත පස් වසරක ඔවුන්ගේ සාදය අවසන් කෙරීමට ගැහැනුන් වන අපි නැගිටිමු.


## යුක්තිය සොයන බලුකිස්තාන කාන්තාවෝ!



ලෝක දෙසින්

පකිස්ථානයේ බලුකිස්ථාන් ප්‍රාන්තයේ පොලිස් අත්අඩංගුවේ සිටි පුද්ගලයෙකු ඇප ලබාගැනීමට දිනකට පෙර එනම් නොවැම්බර් 23 වනදා පොලිස් වෙඩි ප්‍රහාරයකින් මරණයට පත්වීමත් සමග එම ප්‍රාන්තයේ විශාල විරෝධතා ඇතිවූ අතර සති කිහිපයක් ඒකී විරෝධතා දැක්වූ පිරිස් දෙසැම්බර් 21 වැනිදා එරට අගනුවර වන ඉස්ලාමාබාද් නුවරට විරෝධතා දක්වමින් ඇතුළු වූ අතර මෙහිදී පොලිසිය විසින් පිරිස මර්දනය කිරීම සඳහා කඳුළු ගෑස් ප්‍රහාර එල්ල කළ අතර 200 කට ආසන්න පිරිසක් අත්අඩංගුවට ගන්නා ලදහ. මෙම විරෝධතාවල ප්‍රධනත්වය කාන්තාවන් විසින් ගෙන තිබූ අතර බලුකිස්ථාන් ප්‍රාන්තයේ දිගින් දිගටම නීතිය අතික්‍රමණය කරමින් සිදුවන ඝාතන සහ අතුරුදහන් කිරීම නැවතී යුක්තිය ඉටුකරන තුරු දිගින් දිගටම සටන් කරන බව මෙම විරෝධතාකරුවෝ ප්‍රකාශ කරති.

## විරෝධය වෙනුවෙන් ක්‍රීඩාවට සමුදුන් ඇය!




ඉන්දියාවේ ප්‍රමුඛ රෙස්ලින් ශූරියක් ලෙස සැලකෙන 31 හැවිරිදි සාක්ෂි මලික් 2016 වසරේ රියෝ ඔලිම්පික් උළෙලේදී කිලෝග්‍රෑම් 58 බර පංතිය නියෝජනය කරමින් ලෝකඩ පදක්කම දිනාගත්තාය. පසුගිය දෙසැම්බර් 21 වනදා ඇය තමා ක්‍රීඩා දිවියෙන් සමුගැනීමට තීරණය කළ බව නිවේදනය කළාය. ඊට හේතුව වශයෙන් ඇය පෙන්වා දුන්නේ කාන්තා රෙස්ලින් ක්‍රීඩිකාවන්ට ලිංගික අඩන්තෙට්ටම් කල බවට චෝදනා ලැබ සිටි ඉන්දියානු රෙස්ලින් ෆෙඩරේෂනයේ පෙර සභාපතිව සිටි බ්‍රිජ් භූෂන් සිංගේ සහය ලැබූ සංජේ සිං ඉන්දියානු රෙස්ලින් ෆෙඩරේෂනයේ සභාපති තනතුරට පත්වීමට විරෝධය දැක්වීම බවයි. 2023 වසරේ ජනවාරි මාසයේ දින 40 ක් පුරා වීදි බැස රෙස්ලින් ක්‍රීඩකයින් සත්‍යග්‍රහ සිදු කළේද බ්‍රිජ් භූෂන් සිංට විරුද්ධවයි.

## මර්දනය හමුවේ නොසැලෙන ඇෆ්ගන් කාන්තාවෝ!

2021 වර්ෂයේ ඇෆ්ගන්ස්ථානයේ තලේබාන් කණ්ඩායම් පාලනයට පත්වූ තැන් පටන් අනේක විධ ආකාරයෙන් එරට කාන්තාවන්ගේ අයිතිවාසිකම් කප්පාදු කරන ලද අතර අධ්‍යාපනයෙන් සහ රැකියාවලින්ද සමාජ ජීවිතයෙන්ද විතැන් කරන ලදී. කෙසේ නමුත් අහිමි කළ නිදහස සහ ඇෆ්ගන් කාන්තාවන්ගේ අයිතිවාසිකම් නැවත අත්පත් කරගැනීමේ පරමාර්ථයෙන් තලේබාන් පාලනයට එරෙහිව විරෝධතාවයෙහි යෙදෙන ක්‍රියාකාරිනියෝද සිටිති. 2023 සැප්තැම්බර් සහ නොවැම්බර් කාලය තුළ එවැනි ප්‍රමුඛ ක්‍රියාකාරිනියන් වන පරීසා අසාදා, නෙඩා පර්වානී, සෝලියා පර්සි සහ මනීෂා සිද්දීක් යන අය තලේබාන් පාලනය විසින් අත්අඩංගුවට ගත් අතර පසුගිය සති කිහිපය තුළ ඉන් නෙඩා පර්වානී, සෝලියා පර්සි යන අය නිදහස් කරනු ලැබූ අතර පරිසා අසාදා දෙසැම්බර් 25 වන දින නිදහස් විය. මනීෂා සිද්දික් තවමත් අත්අඩංගුවේ පසුවෙයි.

# තත්වයන් අබිබැවූ මිනිසෙකු අවැසිය



එකවරම පතිත වන ව්‍යසනයක දී ඇතිවන කම්පනයට වඩා දිගුකාලීනව, ක්‍රමයෙන් පැන නැඟී, අපට රහසේම ව්‍යප්තව අප මත පතිත වන ව්‍යසනයන් මඟින් ඇත් කරන කම්පනය ප්‍රබලය. සුනාමි තත්වයක් හෝ ගංවතුරක් හෝ සුළි කණාටුවක් හෝ ටෝර්නාඩෝ තත්වයක් හෝ ලැව් ගින්නක් කරනු ලබන විනාශය අනපේක්ෂිත හා භයංකර වුවද, එය පහව යන කාලය සම්බන්ධයෙන් මිනිසාට හැඟීමක් පවතී. වර්තමානයේ විද්‍යාව විසින් දියුණු කරන ලද තාක්ෂණය මේ සම්බන්ධයෙන් නිවැරදිතාවට ආසන්න පුරෝකථනයන් කරනු ලබයි. එසේ නොවූවද මානව ඉතිහාසයේ පරම්පරා ගණනාවක මිනිසුන් ස්වභාවධර්මය සමග කරන ලද නොබිඳුණු ගනුදෙනුවේ ප්‍රතිඵලයක් ලෙස ඒ සම්බන්ධ හැඟීමක් මිනිසාට ඇත.

එහෙත්, රටක් බංකොලොත් කිරීම වැනි අදූරදර්ශී, අකාර්යක්ෂම, මිනිසුන් ගැන සිතනවා වෙනුවට බලය පවත්වාගෙන යාමත්, ධනය රැස්කිරීමත් ගැන පමණක් සිතන පාලකයින් විසින් හිතාමතාම නිර්මාණය කළ ව්‍යසනයකදී ඇති කරනු ලබන කම්පනයෙන් මිදීම පහසු නැත. ඊට හේතුව, එකී ව්‍යසනයන් ආරම්භව බොහෝ කාලයක් ගතවන තෙක් එකී දුෂ්ට පාලකයින් විසින්ම එහි බරපතළකම සඟවා තබනු ලබන බැවිනි. එකී ව්‍යසනයක් මිනිසා මත පතිත වන්නේ පාලකයාට එය තවදුරටත් සිය පාලනයේ තබා ගත නොහැකි අන්දමට බරපතළ වූ අවස්ථාවේදී වන අතර එමඟින් ප්‍රජාව මත ඇති කරනු ලබන බලපෑමද අතිශය දරුණු හා කටුක වේ. වඩාත් වේදනාකාරී වන්නේ එවන් ව්‍යසනයන් පහව යන දවසක් ගැන නිවැරදි පුරෝකථනයක් කිරීමට හෝ කර ගැනීමට කිසිවෙක් අසමත් වීමයි. එවැනි පරිසරයක් තුළ මිනිසා කොතරම් අසරණභාවයට පත්වන්නේද කිවහොත්, තමා බරපතල ව්‍යසනයකට මුහුන දී සිටින්නේ වුවද, තමා ඉන් මිදීමට යමක් කළ යුතු බව හොඳින්ම දන්නේ වුවද කිසිවක් කර කියාගත නොහැකි අන්දමේ අසරණකමකට හෝ අවසඟභාවයකට මිනිසා පත්වේ.

වර්තමානයේ අප රටක් වශයෙන් මුහුණදී සිටින්නේ එවැනි ඛේදවාචකයකටය. අප මිනිස් සමූහයක් ලෙස හැසිරෙමින් සිටින්නේ එවැනි අසරණකමකින් අවසඟවය. එහෙත්, මෙවැනි, අතිශය තීරණාත්මක අවස්ථාවක වුව සිය චිත්ත ඒකාග්‍ර තාව සිඳ බිඳ නොගෙන, සිය අරමුණ වෙනුවෙන් කැපවෙන මිනිස්සු සිටිති. සමාජය ඔවුහු වීරයෝ ලෙස හඳුන්වති. කලා ලෝකයේ බොහෝ නිර්මාණ මෙකී වීරයින් වටා නිර්මාණය වී ඇති අතර තමාට කිසිසේත්ම මිදී පලා යා නොහැකි උගුලක සිරගතව අසරණව ඇතැයි සිතෙන මොහොතක, ඊට එරෙහිව අභීතව සටන් කරන මිනිසුන් වටා නිර්මාණය වූ නිර්මාණ පිළිබඳව සාකච්ඡා කිරීමට මෙය ඉතාමත් උචිත කාලයක් යැයි සිතමු.

මිනිසා භාෂාව සොයා ගන්නටත් පෙර සිටම, මිනිසා හා තදින් බැඳුනු වචන දෙකක් ඇත. ඒවා වචන ලෙස හඳුන්වනු ලබන්නේ වුවද, ඇත්ත වශයන්ම ඒවා තත්වයන් ලෙස පෙන්වා දිය හැකිය. එනම් අභියෝග හා බාධකයන්ය. අභියෝග සාමාන්‍ය ජීවිතයේ එදිනෙදා හමුවන අතර බාධකයන් යනු තමාට තවදුරටත් අබිබවා යා නොහැකි බවට හැඟී යන ඒවාය. මිනිසුන් තිරිසන් සතුනට සමානව සිටි යුගයේ මුහුණදී අබිබවනය කරන ලද්දේ අභියෝග පමණකි. එය සියලු ජීවී ලෝකයට සමාන තත්වයකි. එම යුගයේ බාධකයක් හමුවූ විට අනෙක් සියලුම සතුන්ට මෙන්ම මිනිසාටද හිමිවූයේ විකල්පයන් දෙකකි. එනම්, එක්කෝ එම බාධකය හමුවේම සිට ජීවිතය අහිමි කර ගැනීමය. නොඑසේ නම්, ජීවිතය ගලවා ගැනීමට ඉන් පලා යාම පමණකි. ස්වභාවධර්මය විසින් පොදුවේ කිසිම සත්වයෙකුට මේ විකල්ප හැර යමක් ඉතිරි කළේ නම්, ඒ ඉතාම කලාතුරකින් ඉටුවන අහඹු සිදුවීමක් වශයෙන් පමණකි.

මිනිසා ශිෂ්ටාචාරය ගොඩනැංවීමෙන් අනතුරුව මේ තත්වය සම්පූර්ණයෙන්ම වෙනස් විය. ශිෂ්ට මිනිසා සත්වයන්ගෙන් වෙන් කෙරෙන ප්‍රධාන සාධකයක් වූයේ බාධකයක් හමුවූ විට එය අභියෝගයක් ලෙස බාර ගැනීම හා එම බාධකය අබිබවනය කිරීමයි. මෙසේ මිනිසුන් කළ බාධක අබිබවනය පසුව දැනුම ඔස්සේ පරම්පරාවකින් තවත් පරම්පරාවක් වෙත ගෙනයමින් ඒවා තවදුරටක් බාධක නොවන තත්වයකට පත් කර ඇත. මිනිසා සන්නිවේදනයේ පෙරළිකාරයා බවට පත්කළ භාෂාව නිපදවා ගැනීම මෙන්ම එකී භාෂාව තමාගෙන් මතු පරපුර වෙනුවෙන්ද ඉතිරි කිරීමට හැකිවන පරිදි ගබඩා කර තැබීමට හැකි ලිඛිත භාෂාවක් ගොඩ නැංවීම මීට උදාහරණ වශයෙන් පෙන්වා දිය හැකිය. පසුකාලීනව වඩවඩාත් ශිෂ්ටත්වයට පත්වූ මිනිසා එම භාෂාවම සංස්කෘතිය හා සෞන්දර්යය නිර්මාණය කිරීමට යොදාගැනීම විශේෂ කරුණක් විය.

මිනිසා බාධක අබිබවා යාමට සමත්වුයේ ශිෂ්ටාචාරවත්වීමට සමාන්තරව වූවාක් මෙන්ම මිනිසාට වඩ වඩාත් බාධක නිර්මාණය කරන ලද්දේද ශිෂ්ටාචාරය විසින්මය. ඊට හේතුව ශිෂ්ට මිනිසාගේ අවශ්‍යතා ක්‍රමයෙන් සංකීර්ණ වීමත්, ඒ සංකීර්ණත්වය හේතුවෙන්ම මිනිසුන් වඩ වඩාත් පෞද්ගලිකත්වය කරා යොමුවීමත්ය. ඊට පසුබිම් වූ අර්ථික කරුණු පිළිබඳව යම් පමණකින් මතක් කරනවා හැර මෙම ලිපිය ඒ සම්බන්ධයෙන් ගැඹුරු විග්‍රහයකට නොයයි. කෙසේ වෙතත්, ශිෂ්ට මිනිසාට වඩා වඩාත් බාධක පැන නඟන බවත්, එම බාධක කෙරෙහි අවශ්‍යතා පදනම් වන බවත්, එම අවශ්‍යතා හේතුවෙන් විවිධ පාර්ශවයන් අතර ගැටුම් හටගන්නා බවත්, මේ ගැටුම් හේතුවෙන් මිනිසා විසින්ම මිනිසාට බාධක නිර්මාණය කරමින් පවතින බවත් සරලව වටහා ගැනීම මෙම සාකච්ඡාවට ප්‍රමාණවත්ය.

ලෝකයේ කලාව හා සාහිත්‍යය කෙරෙහි මේ කරුණ තදින් බලපා ඇත. සාහිත්‍යයේ ආදිතම නිර්මාණයන් වන ග්‍රීක වීර කාව්‍ය තුළ මිනිසාට එරෙහිව දෙවියන් විසින් නිර්මාණය කරන බාධක විදහා දක්වයි. ග්‍රීක වීර කාව්‍යවල විශේෂත්වය වන්නේ එකී බාධක හමුවේ මිනිසා පරාජයට පත්වීම උත්කර්ෂයට නැඟීමයි. ඊට වෙනස් මඟක යමින් ඉන්දියානු සම්භාව්‍ය සාහිත්‍යයේ බාධක හමුවේ ධෛර්යමත්ව සටන් වැද ජයග්‍රහණය ලබා ගන්නා වීරයෙක් නිර්මාණය කර ඇත. මහාභාරතයේ එක බොහෝ කතාන්තර මෙන්ම කාලිදාසගේ කෘති, වාල්මිකීගේ රාමායණය වැනි කෘති තුළ දුෂ්ටත්වය විසින් නිර්මාණය කරන බාධක අප්‍රතිහත ධෛර්යයෙන් සටන්වැද ජයගන්නා වීරයින් පිළිබඳව කියවේ. එමෙන්ම, මැදපෙරදිග කලාපයෙන් ලොවට දායාද කළ අග්‍රගණ්‍ය සාහිත්‍ය නිර්මාණයක් වන අරාබි නිසොල්ලාසය හෙවත් එක්දහස් එක් රැය කෘතියද සමස්තයක් ලෙස රජකෙනෙකුගේ දුෂ්ටකමට එරෙහිව සටන්කර ජය ගන්නා ප්‍රඥාවන්ත රජ කුමරියක් ගැන කියවෙන්නෙකි. තවද, පෙරපර දෙදිග ජන සාහිත්‍යය තුළද බාධා හමුවේ බියවී පලා යනවා වෙනුවට ඊට එරෙහිව සටන්වැද ජයගන්නා මිනිසුන් පිළිබඳව සඳහන් වේ.


ඓතිහාසික සහිත්‍යයෙන් නූතන යුග වෙත පියමං කරද්දී මෙම මූලික තේමාව වඩ වඩාත් සෞන්දර්යාත්මකව උත්කර්ෂයට නංවා ඇති බව පෙනේ. නූතන නවකතා-කෙටිකතා ඇතුළු ප්‍රබන්ධ සාහිත්‍යයේ ආදිතම කෘති ලෙස සැලකෙන ඩැනියෙල් ඩෙෆෝගේ රොබින්සන් ක්‍රූසෝ, චාල්ස් ඩිකන්ස්ගේ ඔලිවර් ට්විස්ට්, ඇලෙක්සැන්ඩර් ඩූමාගේ අතිශය ජනප්‍රිය ප්‍රබන්ධය වන සිටුවර මොන්ත ක්‍රිස්තෝ මෙන්ම වික්ටර් හියුගෝගේ ලෙ මිසරාබ්ලෙ (මනුතාපය) වැනි කෘති බොහෝ මිනිසුන් ඉරණම ලෙස පිළිගෙන පරාජයට යටත්වන බාධකයන්ට එරෙහිව අභීතව සටන්වැද මිනිසා විසින් ජයග්‍රහණය ලබා ගැනීම පිළිබඳව කියවේ. මේ අතරින් වික්ටර් හියුගෝගේ මනුතාපය කෘතිය විශේෂිතය.

වික්ටර් හියුගෝගේ ලෙ මිසරාබ්ලෙහි කේන්ද්‍රීය පණිවිඩය යුක්තිය, ආදරය, මිදීම සහ වෙනස් කිරීම සඳහා මානව හැකියාව යන තේමාවන්ගෙන් යුක්ත වේ. මෙම නවකතාව 19වැනි සියවසේ ප්‍රංශයේ පැවැති මානවයාට එරෙහි පංති සමාජය හමුවේ විවිධ චරිතවල හැසිරීම ගැඹුරින් නිරීක්ෂණය කරන කෘතියක් ලෙස පෙන්වා දිය හැකිය. එහි එන විවිධ චරිත ඇසුරින් පුළුල් පරාසයක සමාජ, දේශපාලන සහ සදාචාරාත්මක කරුණු අනාවරණය කිරීමට කතුවරයා සමත් වෙයි. මෙහි තේමාවන් රැසක් පවතී. එක් ප්‍රබල තේමාවක් වන්නේ මිදීම සහ සමාව දීමයි. මිදීමේ හැකියාව සහ සමාව දීමේ පරිවර්තනීය බලය හේතුවෙන් සමාජයෙන් නෙරපනු ලැබූ Jean Valjean (ජනවර්ජන) පුද්ගලිකව වෙනස්කම්වලට භාජනය වන අතර ඔවුන්ගේ අතීත ක්‍රියාවනගෙන් මිදීමට එය මහෝපකාරී වෙයි. එහෙත්, මිනිසා තුළ යහපත නිර්මාණය වීමට එරෙහිව යළි යළිත් නැඟී සිටින අධිපති නීතිය හා සමාජ අසාධාරණය විසින් ජනවර්ජන නැවත නැවතත් අගතියට ඇද දමනු ලබයි. මෙම නවකතාව එවකට පැවති සමාජ හා ආර්ථික අසමානතාවයන්, විශේෂයෙන් දුප්පතුන්ට සහ ආන්තිකයින්ට සැලකීම විවේචනය කරයි. හියුගෝ එමගින් දරිද්‍රතාවය, අයුක්තිය සහ දරුණු දණ්ඩන ක්‍රමය පුද්ගලයන්ට ඇති කරන බලපෑම තියුණුව ගවේෂණය කරයි.

සමාජ අසාධාරණයට එරෙහිව හියුගෝ යෝජනා කරනු ලබන විකල්පය වන්නේ ආදරය සහ දයානුකම්පාව පැතිරවීමයි. මෙම ආදරයේ සහ දයාවේ බලය මනුතාපයේ දක්නට ලැබෙන අපූරු පුනරාවර්තන මෝස්තරයකි. Jean Valjean සහ Bishop Myriel වැනි චරිත කොන්දේසි විරහිත ආදරය සහ ත්‍යාගශීලීත්වය විසින් සෙසු චරිත කෙරෙහි ඇති කරන ධනාත්මක බලපෑම ආකර්ෂණීයය. එහෙත්, එක් පුද්ගලයෙකු යහපත්වීමෙන් සමාජය යහපත් නොවන බව එක් තීරණාත්මක නිමේෂයක දී වටහා ගන්න ජනවර්ජන සිය ප්‍රතිපත්ති පාවා නොදී ඊට එරෙහිව සටන් කිරීම තෝරා ගනියි. තමා ආදරය කරන වස්තුව (පැන්තිනාගේ දියණිය) වෙනුවෙන් සමාජ අරගලයකට මැදිහත්වන

11 වැනි පිටුවට

මිනිසා භාෂාව සොයා ගන්නටත් පෙර සිටම, මිනිසා හා තදින් බැඳුනු වචන දෙකක් ඇත. ඒවා වචන ලෙස හඳුන්වනු ලබන්නේ වුවද, ඇත්ත වශයන්ම ඒවා තත්වයන් ලෙස පෙන්වා දිය හැකිය. එනම් අභියෝග හා බාධකයන්ය. අභියෝග සාමාන්‍ය ජීවිතයේ එදිනෙදා හමුවන අතර බාධකයන් යනු තමාට තවදුරටත් අබිබවා යා නොහැකි බවට හැඟී යන ඒවාය.



"අලුතින් වැඩක් ආරම්භ කරන විට මුලින්ම එන බාධකය නොසැලකිල්ලයි. ඊළඟට විරුද්ධවාදීන්ගේ උපහාසයට මුහුණ දෙන්නට සිදුවේ. එයින් එම කටයුත්ත අධෛර්යමත් කළ නොහැකි නම් දෙවනුව එයට අපහාසාත්මකව කථා කරයි. එයත් අසාර්ථක වූ කල්හි එය විනාශ කිරීමට බලයි. එයත් කළ නොහැකි කල්හි එම වැඩය අගය කරයි. එයට ගෞරව කරයි.

**මහත්මා ගාන්ධි**

# පො ලිටිකල් පංතිය

පොලිටික්ක උදේම පංතියට ඇවිල්ල මෙසෙට ඔළුව ගහගෙන. නිවාඩු දෙන දවස නිසාද කොහෙද. මේසෙ උඩ හම් මල්ලත් එක්ක පෝර බෑග් එකක් වගේ ලොකු මල්ලකුත් නවල උඩින් තිබුණා. පංතියට එන ළමයි ඉස්සෙල්ලම දැක්කෙ මේ නවපු මල්ල, ඊළඟට හම් මල්ල. ඊළඟට පොලිටික්කගෙ අසීරු තට්ටය. ඒකට අසීරු තට්ටය කියල නම තිබ්බෙ කිවුද දන්නෙ නෑ. සීමිත කෙස් රොදකින් අසීමිත තට්ටයක් වහන්න හදපු අසීරු උත්සාහයක් නිසා වෙන්න ඇති කියල තමයි ළමයි කථා වුණේ.

"ගුඩ් මෝනිං සර්..." "වෙරි ගුඩ් මෝනිං සර්" පොලිටික්කගෙ ඇස් යාන්තමට ඉස්සෙන කොටම වසන්තියයි අනුරුද්දියයි පැනලා දුන්නට තාම පොලිටික්කගෙ ඇස්වලින් දෙන්නෙක් පේන්න පටන් ගෙන තිබුණෙත් නෑ.

"ආයුබෝවන් ආයුබෝවන්... ආ... මේ වසන්ති ළමයනෙ..." අඳුනගත්ත පළමු මූණට පොලිටික්ක සුභපැතුව.

"සර් මම තමයි 'වෙරි ගුඩ් මෝනිං සර්' කියලා කිවුවෙ...' අනුරුද්දිය පාන්දරම ආරෝවකට ආව.

"හරි හරි ළමයිනේ මම ආයුබෝවන් කිවුවෙ ඔය ළමයි ඔක්කොටම" පොලිටික්ක ලේන්සුව අරන් මූණ පිහදාලා ගසල දැම්මා ඇස්වහ යන්න වගේ.

"ඇයි සර් ලොකු මල්ලක්" මංජුව එබිල ඇහුවෙ නක්කලේට.

"නෑ නිකං..." පොලිටික්ක ළඟ නැමුවා වැඩිය හිතන්නෙ නැතුවම.

"නිවාඩු ගෙනියන්නද සර්?" කනියටත් හිතෙන දේවල්. "මේ නිවාඩුව බරමට තියෙනවනෙ"

"නෑ ළමයිනේ... අද පොළක් තියෙනවා කිවුව නේද?... බඩු ටිකක් අඩුවට ගන්න පුළුවන් වෙයිද කියල බලන්නත් එක්ක ආවෙ" පොලිටික්ක කිවුවෙ හිර කර ගන්නෙ නැතුව උගුර පාදල.

"බඩු අඩුවට කෙසේ වෙතෙත් සර්ට අඩුවෙන් බඩු අරන් යන්න නම් පුළුවන් වේවි" සමන පුරෝකථනයක් කළා. "අඩුවට බඩු කොහෙද දැන්"

"මිනිස්සුන්ට තව රස්සාවක් කරන්න වෙයි නේද සර්" වසන්තිය ගෙදර වෙච්ච කතාවක් උපුටලා ගත්ත. "මං කිවුවෙ ලබන අවුරුද්දෙ වැඩිවෙන වියදම් පියෝගන්න"

"තේ කෝප්පෙ ඉඳලා පොත් පෑන් පැන්සල්, ටෙලිෆෝන්, ටෙලිෆෝන් ගාස්තු, තෙල් මිල , බස් ගාස්තු, ත්‍රීවීල් ගාස්තු,ගෑස්, වතුර බිල් මේ ඔක්කොම ගණන් යනවනෙ... තව පෙරහැර ලෑස්ති වෙනවා. 18ට වැඩි අයට බදු ෆයිල් අරින්නත් තියෙනවා" මංජුව පපුව කඩා හැලෙන කතා ටික කියාගෙන ගියා.

"මේ ඕක්කොම ගණන් යන හැටියට රස්සා දෙක නෙමෙයි තුනක්වත් කරන්න වේවි" අනුරුද්දියත් දෙබස් දුන්නා.

"ඔව්... බඩු මිල තුන් ගුණයකින් වැඩිවෙලානෙ තියෙන්නෙ" කනියත් ඒකටම අත්වැල් ඇල්ලුවා.

"මිනිස්සුන්ට වැඩිපුර රස්සාම තියෙයි කරන්න... මංජුව බඩ අකුළල පිටේ ගෑව්ව. "තියෙන රස්සාත් නැතිවේගෙන යනවා. කම්පැනි, කඩ වැහෙනවා. බඩු විකිණෙන්නෙ නැති වුණාම කාට ඇරගෙන ඉන්නද? ඉදිකිරීම් කලින්ම වැටුණා. දැන් කරන්ට් බිල වැඩි නිසා අපනයන කර්මාන්තවලට කරන් යන්න බැහැ... වැහෙනවා. පඩි ගන්න මිනිස්සු ඇතේ කීයක්වත් ඉතුරු වෙන්නෙ නෑ. කාටවත් කුලියක් දීල වැඩක් කරවගන්න"

"මොනව වුණත් කමක් නෑ රනිල් මහත්තයගෙ වැට් බදු පනත සම්මත වුණා, 2024 අයවැයත් සම්මත වුණානෙ. ඒ මදෑ... දැන් ඉතින් කලක් යයි" කනිය කට කනට අරන් කිවුව.

"රනිල් පොහොට්ටුවෙ අය බේරනවා. පොහොට්ටු ආණ්ඩුව රනිල්ව බේරනවා. පනත මොකද්ද කියල අදාළ නෑ. ගේන පනත සම්මත කරලා දෙනවා. ආණ්ඩුවෙ පණ තියෙනකම් ඕක ඔහොම තමයි. අර ගමකතාවල වගේ ආණ්ඩුවෙ පණ තියෙන්නෙ ගිරවා ගාව. ගිරව ඉන්නෙ රනිල්ගෙ උරහිසේ" මංජුව උරෙස්සෙ ඉන්න ගිරවෙක් අතගානව වගේ.

"තව කී දවසක් ගිරවට පණ තියේද්ද? ජනාධිපතිගෙ කාලෙ ඉවරවෙනකොට කෙහොමත් ගිරවගෙ පණ ඉවරයි. ඊට කලින් ගිරව මළොත් රනිල්ගෙ කාලෙ කලින්ම ඉවරයි" සමන තවත් පුරෝකථනයක් කළා. "දැනටමත් ආණ්ඩුවෙ ගොඩ දෙනෙකුට නින්ද යන්නෙ නෑ. මහින්ද මහත්තයටත් අමු කැවිලා වගේමයි. වැට් බද්දට අත උස්සල එළියට ඇවිත් විරුද්ධව නිවේදන ගහනවා... සොහොන් ලකුණු පේනකොට ඔහොම වෙනවා ඇති නේද?" සමන කිවුවෙ පොලිටික්ක ලොකු මල්ල තව දෙපාරක් නමල හම් මල්ල ඇතුළටම දාගන්න අතරෙ"

# විප්ලවය සහ පරිණාමය!..




කියුබානු විප්ලවය ජයග්‍රාහී වූ දිනය 1959 ජනවාරි 01 යයි පිළිගැනේ. ඉන් ආස්වාදය ලද්දෝද එය විවේචනය කරන්නෝද ඒ ගැන බොහෝ දේ කියා ඇත; දැනටද කියති.

'ෆර්නැන්ඩෝ මාර්ටිනස් හෙරෙඩියා' නමැති දේශපාලන විචාරකයා ඒ පිළිබඳව පවසා ඇති අදහස් කිහිපයක් යාවත්කාලීන යයි සිතෙන නිසා අපි ඒවා මෙලෙස සටහන් කර තබමු.

"සියලු අභියෝගයන්හි ප්‍රමුඛයා කියුබානු විප්ලවයයි. අවකාශය සහ කාලයේ පැති පිළිබඳව විශ්වාස කරන ප්‍රතිවිරුද්ධ තත්වයන් තිබියෙදීත් එය ජයග්‍රහණය කරන ලද අතර, එකී ක්ෂේත්‍ර දෙකෙන්ම අවම ඉඩකඩක් පවතිද්දීත් එම ජයග්‍රහණය අඛණ්ඩව පැවතිණි. චිත්ත ශක්තියේ පුදුමය ලෙස එය පිළිගැනේ....!"

වත්මන් කියුබාවේ තේමා සහ බලාපොරොත්තු පිළිබඳව මෙහිදී පරීක්ෂා කර බැලීමට මට නුපුළුවන. කියුබානු සමාජවාදය මුහුණ දෙන ත්‍රිත්වාකාර තර්ජන පමණක් ගෙනහැර දැක්වීමට මට පුළුවන.

ඉතාම දරුණු අවධියකට ළංවෙන තත්වයනට ඒම වළකනු වස් ජන ජීවිතය සාමාන්‍ය මට්ටමකින් පැවැත්ම, එමෙන්ම ජාතික ස්වාධිපත්‍යය හා සමාජවාදී රාජ්‍යයේ පැවැත්ම, කියුබාවට මුහුණදීමට තිබෙන සතුරන්ට සහ අනාගතයේ මුහුණදීමට සිදුවන සතුරන් සහ දුෂ්කරතා රාශියක් මැද පවත්වා ගැනීමට සහ සංවර්ධනය කිරීමට අපේක්ෂිත ආර්ථික ව්‍යුහය සහ ක්‍රමෝපයේ ශක්‍යතාවය සහ අඛණ්ඩත්වය හා දැනට සිදුවන ආර්ථික ව්‍යුහයේ පරිවර්තනය තුළින් මතුවන සමාජ ක්‍රමයේ ස්වභාවය එනම් ඉතාම බැරෑරුම් දේශපාලන පරිණාමය සහ රටට මුහුණ දීමට සිදුවන දිගුකාලීන අරගලය සහ ජාත්‍යන්තර සන්දර්භය සහ ප්‍රමාණාත්මක තත්වයන් නිසයි, මෙම පරිණාමයට බඳුන් වනුයේ"

# අමුක - ඩුමුක - අමල් - ඩුමල්...

ඉහත වදන් අමුණා සිංදුවක් හැටියට ගොතාගෙන කියමින් නටන අලුත් "ට්‍රෙන්ඩ්" එකක් මේ දිනවල සමාජ මාධ්‍යවල පැතිරී යයි. එය 'රාණිගේ සුදිය' නමැති මදනමෝදක වර්ගය කා සිහිවිකල් වූ සමහර දකුණු ඉන්දියානු තරුණයන් වීදිවල නටමින් මග යන එන කෙල්ලන්ට ලිංගික කටයුත්තකට අනියමින් ආරාධනා කරන අරුත් ඇති වදන් පෙළක් බව ඒ ගැන දන්නෝ කියාපාති.

ඒ වගේම තමන් කියන කරන දේ මොනවාද ඉන්න තැන කොතැනද ආදිය ගැන මෙලෝ හාංකවිසියක්වත් නොදන්නා, අර 'රාණිගේ සුදිය' ගසා මොළේ කචල් වෙලා යැයි සිතිය හැකි " අමුක - ඩුමුකයෙක්" ඊයේ පෙරේදා මෙවැනි කථාවක් කර තිබුණි.

"මේ ආණ්ඩුව අනුගමනය කරන්නේ අපේ බදු ප්‍රතිපත්තිය නොවෙයි. මේක මහජනතාවට පීඩාකාරියි. අපේ ආණ්ඩුවකින් අපි මෙය වෙනස් කරනවා"



මෙය කියන්නේ අර රුසියානු ලේඛක ගොගොල්ගේ කතාවක එන මිය ගිය වහලුන් සොයමින් ඔවුන් මිලට ගනිමින් ඔවුන් නැවත විකුණං කෑ වර්ගයේ තණ්හාධික වියරුවකින් පෙළෙන ලාංකේය මිනිසෙකි. ඔහු නමින් මහින්ද රාජපක්ෂය.

මොළය මිය ගිය මිනිසුන් විසින් පාලනය කරනු ලබන රටක මෙවැනි දේ පුදුම දේවල් නොවේය.

මුන් මේ කරන්නේ තමන්ට රැවටුණු ජනතාවට නැවත නැවතත් අපහාස කිරීම නොවේද?

මේ රැවටිල්ල සත්‍ය ලෙස තවදුරටත් ඔබ බාර ගන්නේද? මේ වියරු අමනුෂ්‍යයන්ගේ බොරුව තවදුරටත් ඔබ ඉවසා සිටිය හැකිද? එසේ වුවහොත් ඔබ වැනි සත්ව කොට්ඨාසයක ජීව විද්‍යාත්මක නාමය සොයා ගැනීමට නූතන විද්‍යාවත් අසමත් වනු නියතය.

# අලුත් අවුරුද්දට



මිසයිල, සබ්මැරීන, අහස් යුද නැව්, ජීව වායු අවි අපිව හෙම්බත් කළේය.

රෝබිය, සංකාව, දිළිඳුකම,
සූරාකෑම, අනිස්ථිරත්වය, නූගත්කම,
බෝම්බ හෙළීම සදහටම එපා...

මට ඕනෑ එකම දෙයයි
එය තමයි සාමය වෙත
සමාන සමාජයක් වෙත
සාධාරණය වෙත පිය නැගීම

පිරිසිදු වාතයෙන් හුස්ම ගැනීම
පිරිසිදු ජල බිඳක් බීම
අලුත් බෝග වැවීම
වැස්සේ තෙත බරියන් වීම

කුණුකන්දල් සෝදා හැරීම
සිරුර හා ආත්මය සාමයේ සීහුමෙන් තැබීම
විතරයි මට ඕනෑ
වළකනු මහා විනාශය

නොදකින දෑස්
රැවටෙන සිත්
උරුමයෙන් ලද දීනකම
ඉවත නොලන මිනිසුන්
එපා මට එපා....!

(කළු ජාතික කාන්තා විමුක්තිකාමී කිවිඳියක වන, ජේන් කෝර්ටේස් විසින් රචිත "පුෂ්බැක් ද කැටැස්ට්‍රොෆි" (මහා විනාශය වැළැක්වීම) යන කාව්‍ය රචනාවෙන් උපුටා ගන්නා ලදී.

## නව වසර...

01 පිටුවෙන්

සංඛ්‍යා දත්තවලින්. අපි සහ ඔබට මේ අර්බුදය පෙනෙන්නේ ජීවිතවලින්. ආර්ථිකය කඩා වට්ටවා, සමාජය පතුළටම බිඳ දමා, අපරාධ වර්ධනය කර, අයුක්තිය තහවුරු කළ අසාධාරණය කෙළ පැමිණි අපරාධකාරයින් පාලනය කරන රටක් නිර්මාණය කර, ඔවුන් ගිණුම්කරන දත්තවලින් ජයග්‍රහණ ගැන උදම් අනනවා. කඩා වැටුණු රට ගොඩගත හැකි වන්නේ නව ජාතික පිබිදීමකින්. අපි සියලු දෙනා ක්‍රියාකළ හොත් පමණයි. එළඹෙන වසරේ දේශපාලන වෙනස සිදු නොකරන්නේ නම්, ගැහැනු ඔබට තව තවත් අවමානයට ලක්වෙන්න පුළුවන්. මේ පීඩනයේ ගොදුරු බවට තව තවත් පත්වෙන්න පුළුවන්. තව තවත් හූල්ලමින් දරුවන් සම්බන්ධයෙන් අපේක්ෂා භංගත්වයට පත්වෙන්න පුළුවන්. අපි ඔබට යෝජනා කරන්නේ හූල්ලමින් සිටින ජීවිතයක් නොවෙයි. ශක්තිසම්පන්නව ඉදිරියට පැමිණ මෙය වෙනස් කිරීමට සංවිධානය වන ලෙයසි.

මෙතෙක් සහෝදරියන් තුළ තිබූ නිහඬතාවය, නිද්‍රාශීලිත්වය, මුළුමනින්ම ඉවත් කර, දිස්ත්‍රික් සමුළුවක් ලෙස පවත්වන, දැවැන්තම කාන්තා බලවේගය එකතු කොට තිබෙනවා. අපේ රටේ තිබුණු පිරිමි කේන්ද්‍රගත කොට ගත් දේශපාලනය වෙනුවට ඉතාම ශක්තිමත් ක්‍රියාකාරී මැදිහත්වීමකට ගැහැනුන් ඉදිරියට පැමිණ සිටිනවා. ගෙදර මුල්ලකට කර තිබූ කාන්තාව තුළ සැඟවුණු විශාල ශක්තිය මුදාහරිමින් අද පෙරමුණට ඇවිත් සිටිනවා. ලංකාවට විදේශ විනිමය වැඩිපුරම උපයාගෙන විදෙස්ගත ශ්‍රමිකයන් හැටියට විශාල ගැහැනුන් පිරිසක් ක්‍රියාකරනවා. ඊළඟට ආසන්න වශයෙන් ඩොලර් බිලියන පහක වැඩිම විදේශ විනිමය උපයා දෙන ඇඟලුම් කර්මාන්තයේ නියැලී සිටින විශාලතම පිරිස ගැහැනුන්. තුන්වන වැඩිම විදේශ විනිමය ප්‍රමාණය උපයාදෙන තේ කර්මාන්තයේ විශාලතම පංගුව දරන්නෙත් ගැහැනුන්. තව පැත්තකින් පාසල් අධ්‍යාපනයේ 70%ක් පමණ සිටින්නේ ගුරුවරියන්. සෞඛ්‍ය සේවයේ වැඩි පංගුවක් තිබෙන්නේත් ගැහැනුන් අතේ. ඒ නිසාම පවතින ක්‍රමය වෙනස් කිරීමේ වැඩිම දේශපාලන සක්‍යතාවය තිබෙන්නේත් ගැහැනුන් අතේ.

මේ රට ගොඩගන්නා ප්‍රධානම බලවේගය බවට ගැහැනිය පරිවර්තනය කළ යුතුයි. පැරණි කියමන් පැරණි යථාර්ථයන් සියල්ල පැත්තකින් තබා නව රටක්, නව ලෝකයක්, ගොඩනැගීමේ පුරෝගාමී වැඩකොටස කරන ගැහැනුන් බවට පත්වීමේ ස්ථිර අධිෂ්ඨානය ඇතිකර ගන්න ඕනෑ. ලංකාව පුරා මෙවැනි සමුළු පවත්වා ගැහැනුන් ප්‍රබල ලෙසම බල ගන්වනවා. මේ රට නැවත ජාතික පිබිදීමේ මාවතකට ගෙන එන්න ඕනෑ."

2023 දෙසැම්බර් 13

# ගිණුම්කරණ තුලිතභාවයක සිට

# ආර්ථික දේහයේ පරිවර්තනයකට රට ගෙන යා යුතුයි

*(2024 අයවැය තෙවැනි වර කියවීමේ විවාදයට එක්වෙමින්)*

'ආර්ථිකය කඩාවැට්ටවීමේ වරදකරුවන් කවුද කියා සොයන්න ඕන නැහැ, ඒක අතීතයේ,' කියා. නිමල් සිරිපාල කිවුවත්, ඒක කාලය විසින් යටකරන්න නොහැකි අතීතයක්. මහජනයාගේ ධනය සොරකම් කළ, නාස්ති කළ, වැරදි ව්‍යාපෘති ගෙනාපු, ඒවාට අත එසවූ, ඒ අවස්ථාවල කැබිනට් එකේ සිටි ඔබතුමාට ඒ අතීතය අමතක කරන්න ලෙහෙසියි. හැබැයි ජනතාව ඒ අතීතය අමතක නොකළ යුතුයි.

ජනාධිපතිතුමා කිව්වා 2002 සිට විශාල වරදක් කර තිබෙන බවත්, ඒ වැරැද්දේ ප්‍රතිවිපාකවලට තමයි මේ මුහුණ දීමට සිදුවී තිබෙන්නේ කියා. නමුත් වැරදි කළ අය ඒ වරදට මුහුණ දෙන්නේ නැහැ. නිමල් සිරිපාල මහතා ඒකට මුහුණ දෙනවාද? ඔබතුමා 1994 සිට බිහිවුණු සෑම ආණ්ඩුවකම ඇමති. චන්ද්‍රිකාගේ ආණ්ඩුවේ, මහින්දගේ ආණ්ඩුවේ, මෛත්‍රීපාල සිරිසේනගේ ආණ්ඩුවේ, ගෝඨාභයගේ ආණ්ඩුවේ, දැන් වර්තමාන ආණ්ඩුවේ. ඔබතුමා කියනවා කඩා වැටීම අතීතයේ. ඒක අමතක කරන්න කියලා. ඔබ මේ කඩා වැටීමට වගකිව යුතු, තීන්දු තීරණ ගන්නා විට අත ඔසවපු, ඒ වෙනුවෙන් මැදිහත් වුණු කෙනෙක්. අතීතය එසේ අමතක කළ නොහැකියි. මේ වැරදි කළ අය නොවෙයි මේ ප්‍රතිවිපාකවලට මුහුණ දී තිබෙන්නේ. කන්න නැතිව, දරුවාට හරිහැටි බෙහෙක් පෙත්තක් නැතිව, තමන්ගේ මූලික අවශ්‍යතා ඉටුකර ගැනීමට නොහැකිව, ඉන්නේ වැරදි කළ අය නොවෙයි. මේ රට ගොඩනැගීමට නම් වැරදි කළ අය ඉවත් කළ යුතුයි. ඒක ඡන්ද කතාවක් නොවෙයි, ආර්ථික කතාවක්. රට වට්ටලා, ගත හැකි තින්දු තීරණ අරගෙන දැන් සාමකාමීව මේක ගොඩග නිමුයි කියනවා.

මේ රට මේ විපතට පත් කළ අයව බලයෙන් පහ කර, ජාතික පිබිදීමක් ඇති කළ යුතුයි. ඒ පිබිදීම ඇති කළ හැක්කේ මේ පාලක පංතියට එරෙහිව කරන දේශපාලනයෙන් පමණයි. අපට ඉතිහාසයේ ශක්තිමත් නිදහස් සටනක් තිබුණේ නැහැ. දියුණු වුණු සෑම රටක්ම බැලුවහොත් ඒ සෑම රටකම නිදහස් සටනක් තිබුණා. ඉන්දියාව, එක්සත් ජනපදය, චීනය, ජපානය, වියට්නාමය මේ සෑම රටකම නිදහස් සටනක් තිබුණා. ඒ නිදහස් සටන විසින් ජනතාව පුබුදු කළා. ඒ ගන්නාවූ ධෛර්යය තමයි ඒ රටවල් පරිවර්තනය කළේ. අපට සිටියේ නිවට නියාලු නායකයෝ. ජාතිය පුබුදු කරවීමට හැකි මනසක් හා දැක්මක් තිබුණු නායකයන් අපට සිටියේ නැහැ. ඒ නිසා මේ රටේ ජාතිය පුබුදු කරවන්න බැරි වුණා. කොරියාවේ, තායිලන්තයේ, ඉන්දියාවේ පාලකයන්ට හැකි වුණා ජාතිය පුබුදු කරවීමට. මේ රට ගොඩනැගීමට නම් ජාතිය අලුතින් අවදි කළ යුතුයි. රට අද දැවැන්ත අර්බුදකාරී, දැවැන්ත කඩාවැටීමක තිබෙනවා. හුදු දේශපාලන පරිවර්තනයක් නොමැතිව මේ රට ගොඩනැගිය නොහැකියි. මේ රට ගොඩනැගිය හැක්කේ, දේශපාලන පරිවර්තනයකට නායකත්වය දිය හැකි පොදු මහජන ව්‍යාපාරයක්, බලය අත්පත් කර ගැනීමත්, ඒ ව්‍යාපාරය හරහා ගොඩනගන මහා ජනතා පිබිදීමක් මගින් තමයි මේ රට පරිවර්තනය කළ හැක්කේ. මේ රට විනාශ කළ, මේ රට කනත්තට දක්කපු කණ්ඩායමට මේ රටේ ජනතාව නැගිට්ටවන්න බැහැ.

ජනාධිපතිතුමා කිවුවා එතුමා මේ අසීරුතාවයෙන් රට ගොඩගත්තා කියලා. ගිණුම් කරන විසඳුමක් මේක ඇතුලේ තිබෙනවා. අපට අවශ්‍යවී තිබෙන්නේ ගිණුම්කරණ විසඳුමක් විතරද? අපට අවශ්‍ය වන්නේ ජනතාවගේ ආර්ථික දේහයේ විසඳුමක්. නොවැම්බර් මස 30වැනිදා වන විට අපේ රටේ සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාවසායකයන් කීදෙනෙක් පරාටා නීතිය හරහා බැංකුවලට පවරාගෙන වෙන්දේසි කර තිබෙනවාද? සම්පත් බැංකුවේ ආයතන 296ක්, එච්.එන්.බී. එකේ ආයතන 215ක්, ඩී.එෆ්.සී.සී. එකේ ආයතන 129ක්, සෙලාන් බැංකුවේ ආයතන 120ක්, මේ වසරේ ජනවාරි 01වැනිදා සිට නොවැම්බර් මස 30 දක්වා සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයන් 1183ක් කඩා වැටී තිබෙනවා. යම් වෙළඳපොළක් හදාගෙන එය දියුණු කරගත් කර්මාන්ත කඩා වැටී තිබෙනවා. සුවඳ විලවුන් කර්මාන්තය, දේශිය රෙදි නිෂ්පාදන කර්මාන්තය, සපත්තු කර්මාන්තය කඩා වැටී තිබෙනවා. දේපොළ වෙන්දේසි කරනවා. අඩුම තරමේ බැංකුව මේ කර්මාන්ත වෙන්දේසි කරන්නේ ඒ ඒ ව්‍යවසායකයන්ගේ කළමනාකරණ ප්‍රශ්නයක් හෝ නව තාක්ෂණය බද්ද නොකරගත් නිසා හෝ නිමැවුම්වල ගුණාත්මකභාවයක් ආරක්ෂා නොකළ නිසා නොවෙයි; පසුගිය ආණ්ඩු දීර්ඝ කාලයක් තිස්සේ අනුග මනය කරන ලද ආර්ථික ප්‍රතිපත්තිය හේතුකොටගෙ නයි. ඒ නිසා ජනතාවගේ



ජාතික ජන බලවේගයේ පාර්ලිමේන්තු කණ්ඩායම් නායක
**අනුර දිසානායක සහෝදරයා**

මිලදී ගැනීමේ හැකියාව දුර්වල වුණා. නන්දලාල් මහතා බැංකු පොලී අනුපාතිකය 30% දක්වා වැඩි කළා. එය සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර කඩා වැටීමට බලපෑවා. ව්‍යාපාර 1183ක් වෙන්දේසි කිරීමට සූදානම් කර තිබෙනවා. එය ආර්ථිකයේ හොඳ ප්‍රතිඵලයක්ද?

අපේ රටේ බහුදින ධීවර යාත්‍රා 50%ක් මුහුදු ගමන් නවතා ගැටගසා තිබෙනවා. මුහුදු සම්පත නෙළා ගන්න මේ යාත්‍රා මුහුදට තල්ලු කරන්න ඕනෑ. ඩීසල්වලට, පෙට්‍රල්වලට සහ අනෙකුත් භාණ්ඩවලට විශාල ලෙස වැට් බදු පනවනවා. ධීවරයා මුහුදු ගමන නවතනවා. හැබැයි ගිණුම බැලන්ස්. මේකට උත්තරය එකවුන්ට් එක බැලන්ස් කරන එක පමණක් නොවෙයි. ආර්ථික දේහයේ නව පරිවර්තනයක් අවශ්‍යයි.

> දැන් දරුවා යාන්තමින් වැල් පාලමෙන් ඉස්සරහට ගෙනගියා කියලා කියනවා. දරුවා යන කොට දරුවාගේ කලිසමත්, සපත්තු දෙකත්, තොප්පියත්, බෙල්ලෙ තිබුණු පංචායුධයත් නැහැ. දරුවා ඉන්නවා. රටට කර තිබෙන්නේ මේක.

කඩා වැටෙමින් තිබෙන සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයා, ධීවර කර්මාන්තය, කෘෂිකර්මාන්තය, අනෙකුත් කර්මාන්ත හා සේවාවන් ගොඩනැගීම සඳහා හදපු සැලසුම් මොනවාද? මෘදුකාංග ලංකාවේ සමාග මක් නිෂ්පාදනය කර, ලංකාවේ සමාගමකට විකුණනවා නම්, ඒකට බද්දක් ගන්නවා. අපේ රටේ යම් දක්ෂතාවයක් තිබෙන තරුණයෙක් මෘදුකාංග වෙළඳපොළට ඇවිත් ක්‍රමානුකූලව තමන්ගේ ව්‍යාපාරය ගොඩනගාගෙන ඔවුන් ලංකාවෙන් පිටතත් මාර්කට් එක සොයා ගන්න අවස්ථාව. ලංකාවේ මාර්කට් එකෙන් කියනවා ඔයගොල්ලෝ අපෙන් සොෆ්ට් වෙයාර් එකක් මිලදී ගත හොත් අපි බද්දක් ගහනවා. නමුත් විදේශීය සමාගමකින් මිලදී ගතහොත් බද්දෙන් නිදහස්. දක්ෂතාවය තිබෙන තරුණ පරම්පරාවක් මෘදුකාංග වෙළඳපොළේ ස්වයංව ගොඩනැගුණු සමාගම් කිහිපයක් තිබෙනවා. ඒ සියල්ලම තමුන්නාන්සේලා කඩා වට්ටවනවා. හැබැයි ගිණුම බැලන්ස්. වර්ධනය වෙමින් තිබුණු මෘදුකාංග වෙළඳපොළ කඩා වට්ටනවා.

මේ හදන්නෙ තිබෙන සමාගම් ටිකත් එලවන්න. මෘදුකාංග වෙළඳපොළ තුළ ලෝකයේ නව තාක්ෂණය අත්පත් කරගත හැකිවීම මත තමයි ලෝකයේ ආර්ථික වර්ධනය අත්පත් කර ගන්නවාද නැද්ද යන්න තීරණය වෙන්නේ. ලෝකයේ අහස දිහා බලා වගාකරන යුගයක් තිබුණා. මංසන්ධිය දෙස බලා කඩයක් දාන යුගයක් තිබුණා. ලෝකය ඉවට ගමන් කළ කාලය ඉවරයි. අද ලෝකය ගමන් කරන්නේ දත්ත, දත්ත විශ්ලේෂණය, දත්ත මත තෝරා ගන්නා නිගමනයන් මත. තාක්ෂණය මත ලෝකය ඉදිරියට ගමන කරමින් තිබෙනවා. දැන් දරුවා යාන්තමින් වැල් පාලමෙන් ඉස්සරහට ගෙනගියා කියලා කියනවා. දරුවා යන කොට දරුවාගේ කලිසමත්, සපත්තු දෙකත්, තොප්පියත්, බෙල්ලෙ තිබුණු පංචායුධයත් නැහැ. දරුවා ඉන්නවා. රටට කර තිබෙන්නේ මේක. අපේ රටේ භාණ්ඩ හා සේවා නිෂ්පාදනය සඳහා නව පරිවර්තනයක් කිරීමට සැලැස්මක් අවශ්‍යයි. මේ ආර්ථිකය ගොඩනැගීමට ගිණුම්කරණයේ තුලිතභාවයක් යම් තරමකට අවශ්‍යයි. ගිණුම්කරණයේ තුලිතභාවයේ සිට ක්‍රමානුකූලව ආර්ථික දේහයේ පරිවර්තනයකට යා යුතුයි.

## රටට නව දේශපාලන...

03 පිටුවෙන්

කණ්ඩායමට එරෙහිව අපේ රටේ ජාතික ඒකාග්‍රතාවය ගොඩනගා ස්ථාපිත කරන නවමු ව්‍යාපාරයක් අවශ්‍යයි. රටට නව දේශපාලන පරිවර්තනයක් අවශ්‍යයි. ජාතික ජන බලවේගය මෙම මැතිවරණවලට තරග වදින්නේ අන්න ඒ ජාතික ඒකාග්‍රතා සහිත නව පන්නයේ ජාතික නිදහස් අරගලයක ස්වරූපයෙන් සහ මැදිහත්වීමෙන්. මෙය හුදු ආණ්ඩු මාරුවක් හෝ හුදු නායකයන්ගේ මාරුවක් නොවේ. රටට මේ පරිවර්තනය සිදු කළ යුතුයි.

මේ වසරේ ඒ සඳහා හොඳ ඉතාමත් පුළුල් ඉඩකඩක් විවෘත වී තිබෙන බව අපි විශ්වාස කරනවා. ඉතා පැහැදිලි ලෙස බලය මාරුවෙන මැතිවරණයක් මෙ වසරේ පැවැත්විය යුතුමයි. එය මඟහැර යන්න රනිල් වික්‍රමසිංහට හෝ ඔහුගේ ප්‍රජාතන්ත්‍ර විරෝධී ගමනට හැකියාවක් ලැබෙන්නේ නැහැ. ඒ නිසා මෙම අවස්ථාව අපි ඉතාමත් සාර්ථක ලෙස උපයෝගී කර ගත යුතුයි. අපි ජනතාවට ආරාධනය කරන්නේ දීර්ඝ කාලයක් තිස්සේ පැවති අපේ රටේ ගමන්මග වෙනස් කර, නව පන්නයේ ජාතික නිදහස් අරගලයකට අපි ප්‍රවිෂ්ට වෙමු. අපේ රට නිදහස් කර ගැනීමේ අරගලයකට, අපේ රටේ ආර්ථිකය කාබාසිනියා කළ චෞර වළල්ලෙන් අපේ රට නිදහස් කර ගැනීමේ අරගලයකට, ආර්ථිකයේ සියලු මර්මස්ථාන විනාශ කොට විකිණීම දක්වා ගමන්කර තිබෙනවා වෙනුවට රටේ සම්පත් හා මානව සම්පත් කළමනාකරණ හැකියාව ඒකාබද්ධ කොට, ලෝකයේ දියුණු ජාතියක් බවට පරිවර්තනය කිරීම සඳහා ඉතාමත් හොඳ වැඩපිළිවෙළක් සහිතව අපි මැතිවරණයට අවතීර්ණ වෙනවා. අපි ජනතාවගෙන් ඉල්ලා සිටින්නේ මෙම පරිවර්තනයේ සක්‍රීය කොටස්කරුවෙකු බවට පත්වෙන්න. ඒ වෙනුවෙන් ජාතික ජන බලවේගය සියලු කණ්ඩායම්වලට විවෘත ආරාධනයක් මේ වසරේ ආරම්භයත් සමග සිදුකරනවා.

## තත්වයන් අබිබැවූ...

09 පිටුවෙන්

ජනවර්ජන එහිදී තමාගේ පරම සතුරාට සමාව දී සිය විශිෂ්ට මානව ගතිගුණ සපථ කරයි. එය එසේම විය යුතුය. ශ්‍රේෂ්ට මිනිසුන් කිසිවිට ක්‍රමය විසින් හසුරුවන මිනිසුන්ගේ දුෂ්ටකම්වලට එරෙහි පෞද්ගලික වෛරයක් නොදරන අතර වෙනස් කළ යුතු සැබෑ යථාර්ථය වන ක්‍රමය වෙනස් කිරීම කෙරෙහි පමණක් විශ්වාසය තබයි. මෙම නවකතාව පුද්ගලයාගේ සදාචාරාත්මක හෘදය සාක්ෂිය සහ සමාජ අපේක්ෂාවන් අතර ආතතිය පරීක්ෂාවට ලක්කරයි. පුද්ගල ආචාර ධර්ම සහ දෘඩ සමාජ ව්‍යුහයක් විසින් පනවා ඇති සීමාවන් අතර ගැටුම සමඟ චරිත බොහෝ විට පොරබදනු ලබයි. එහිදී හියුගෝ විසින් යුක්තිය හඹා යාමේ විශ්වාසය සහ සාධාරණ සමාජයක් සාක්ෂාත් කර ගැනීමේදී මානව දයාවේ වැදගත්කම නැවත නැවතත් පිළිබිඹු කරයි. නවකතාව තුළ අධිපති නීති පද්ධතියේ සඵලතාවය ප්‍රශ්න කරනු ලබන අතර, සැබෑ යුක්තිය පසිඳලීමේදී මානව දයාවේ කාර්යභාරය තදින් අවධාරණය කරයි.

වීරයින් බිහිකරනු ලබන්නේ අතිශය දුෂ්කර අවස්ථාවන්ට ප්‍රායෝගිකව මුහුණ දීමේදී දක්වන සමත්කම නැවත නැවතත් පරීක්ෂාවට ලක්කිරීම තුළිනි. මෙම නවකතාවේ චරිත මුහුණ දෙන දුෂ්කරතා නොතකා, නවකතාව මිනිස් ආත්මයේ ඔරොත්තු දීමේ හැකියාව අපගේ අවධානයට යොමු කරවයි. ධනාත්මක වෙනස්කම් සඳහා ශක්තිය, ධෛර්යය සහ හැකියාව පෙන්නුම් කරමින් පුද්ගලයන්ට ඔවුන්ගේ තත්වයන්ට වඩා නැඟී සිටිය හැකි බව එයින් යෝජනා කරයි. මනුතාපය යනු දශක ගණනාවක් පුරා දිවෙන ආඛ්‍යානයක මෙම තේමා එකට ගෙතී ඇති පොහොසත් සහ බහුවිධ ප්‍රබන්ධයකි.

# නියමුවා

ජනතා විමුක්ති පෙරමුණේ මධ්‍යම පුවත්පත

464/20. පන්නිපිටිය පාර පැලවත්ත. බත්තරමුල්ල දුර. 0112-785612 Email: niyamuwanews@gmail.com




ස්විට්සර්ලන්ත තනාපතිතුමිය හමුවී...



විසඳුම වෙනුවෙන් ජන බලය - අරණායක



කිරි සම්පත රැකගැනීම වෙනුවෙන්...



සමාජවාදී තරුණ සංගමය සුබ ජන වසරක් වෙනුවෙන්...



විදුලිය විකිණීමට එරෙහිව ජන සටනේ...



සහෝදරත්වයේ දිනය - රෝමය

# ජාතික සමගිය රකින, ආර්ථිකය ගොඩනගන ජනතාවාදී ආණ්ඩුවක් හදමු



ජාතික ජන බලවේගයේ නායක අනුර කුමාර දිසානායක සහෝදරයා

ජාතික ජන බලවේගය ජනතාව හමුවට පැමිණ තිබෙන්නේ, පවතින තත්වය වෙනස් කරමු යන යෝජනාව කිරීම සඳහා බව ප්‍රකාශ කළ ජාතික ජන බලවේගයේ නායක අනුර කුමාර දිසානායක සහෝදරයා, උතුරේ දමිළ ජනතාවත්, නැගෙනහිර මුස්ලිම් ජනතාවත්, දකුණේ සිංහල ජනතාවත් සියලු දෙනාම එකතු වී මේ රට හදමු, ජාතිවාදය නොමැති ජාතික සමගිය රකින, ආර්ථිකයක් ගොඩනගන ආණ්ඩුවක් හදමු යැයි කල්මුණේ ජනතාවට ආරාධනා කළේය.

අනුර දිසානායක සහෝදරයා මේ අදහස් පළ කළේ පසුගිය 15වැනි දින කල්මුණේ සයින්දමරදුහි පැවති ජාතික ජන බලවේගයේ කල්මුණේ ආසන සමුළුව අමතමිනි. මෙහිදී වැඩිදුරටත් අදහස් දැක්වූ අනුර දිසානායක සහෝදරයා මෙසේද පැවසීය.

"ලෝකයේ අයුක්තිය, අසාධාරණය කොතනද, ඒකට විරුද්ධව හඬක් නගන්න ලැහැස්තියි. ඒ වගේ ආණ්ඩුවක් අපි හදමු. මේ රට වෙනස් කරන පාරක් අපට ඕනෑ. දීර්ඝ කාලයක් මේ කල්මුණේ ප්‍රදේශයේ සහෝදරවරු ඉතා ශක්තිමත්ව අපිත් සමග ඉන්නවා. මේ අය මෙතෙනට පැමිණියේ තමනට පුද්ගලිකව දෙයක් ලබාගැනීමට නොවෙයි. ආණ්ඩුවට එන සෑම සතයක්ම පෙරළා ජනතාවට යන ආණ්ඩුවක් හදන්න ඕනෑ. මම තරුණ පරම්පරාවට ආරාධනා කරනවා අපිත් එක්ක එකතු වෙන්න කියලා. ඉදිරියට එන්න තිබෙන ව්‍යාපාරය ජාතික ජන බලවේගයයි. අගෝස්තු මාසේ ජනාධිපති ඡන්දය ප්‍රකාශයට පත්වෙනවා. අපට මාස අටයි තිබෙන්නේ. සෑම ගෙදරකටම අපි යමු. හැම කෙනෙක්ම හමුවෙමු. රට වෙලාගෙන තිබෙන විනාශය කතා කරමු. මේක වෙනස් කරන්න එන්පීපී එක සමග එකතු වෙන්න කියා ආරාධනා කරමු. කලින් කුමන අයෙකුට ඡන්දය පාවිච්චි කළ කෙනෙක් වුණත් ඒ හැම දෙනාටම ආරාධනා කරමු. මේ රට වෙනස් කරන, රට ගොඩනගන අලුත් ගමනක් යමු. උතුර, දකුණ, නැගෙනහිර අපි ඔක්කෝම එක මවකගේ දරුවන් වගේ සහෝදරත්වයෙන් ඉන්න රටක් අපි හදමු. ලෝකයේ ඕනෑම රටකදී මම ශ්‍රී ලාංකිකයෙක් කිව හැකි රටක් අපි හදමු. අපේ දරු පරම්පරාවට එහෙම රටක හදා දෙමු. මේ රටට කර තිබෙන විනාශය ඔක්තෝබර් අවසන් වෙන්න කලින් අවසන් කරමු."

# දූෂිත ඖෂධ ගනුදෙනුවට සම්බන්ධ දේශපාලකයන් නීතිය හමුවට ගෙන ආ යුතුයි



ජාතික ජන බලවේගයේ ජාතික විධායක සභික වෛද්‍ය නලින්ද ජයතිස්ස සහෝදරයා

දූෂිත ඖෂධ ගනුදෙනුවේදී ආණ්ඩුව තමන්ගේ දේශපාලන සගයන් ආරක්ෂා කිරීමට කටයුතු කරමින් සිටින බව පෙන්වා දුන් ජාතික ජන බලවේගයේ ජාතික විධායක සභික වෛද්‍ය නලින්ද ජයතිස්ස සහෝදරයා, මේ සම්බන්ධයෙන් උපදෙස් දුන් බව ප්‍රකාශ වෙන දේශපාලන හස්තයන්, දේශපාලන බල අධිකාරීන්, තවදුරටත් ආරක්ෂා නොකර නීතිය හමුවට ගෙන ආ යුතු යැයි ආණ්ඩුවට බලකර සිටියේය.

වෛද්‍ය නලින්ද ජයතිස්ස සහෝදරයා මේ බව පැවසුවේ පසුගිය 19වැනි දින ජ.වි.පෙ. ප්‍රධාන කාර්යාලයේ පැවති මාධ්‍ය හමුවේදීය. මෙහිදී වැඩිදුරටත් කරුණු දැක්වූ වෛද්‍ය නලින්ද ජයතිස්ස සහෝදරයා මෙසේද පැවසීය.

"ප්‍රශ්න ගත ඉමියුනොග්ලොබියුලීන් ඖෂධ ඒකක 22500 රාජ්‍ය ඖෂධ සංස්ථාව විසින් පසුගිය ජූලි සිට සැප්තැම්බර් අතරතුර මිලදී ගෙන රජයේ රෝහල්වලට ලබාදී තිබෙනවා. ඒ ඖෂධය ලබාදුන් රෝගීන්ගෙන් සංකූලතා වාර්තා වූ බව රෝහල් කිහිපයකින් අමාත්‍යාංශයට දන්වා තිබුණා. පසුගිය ආර්ථික අපහසුතා ඇති වූ අවස්ථාවේ ඉන්දියාව විසින් අපට ආහාර සහ ඖෂධ මිලදී ගැනීම සඳහා ණය පහසුකම (Indian Credit Line) ලබාදුන්නා. එම ණය පහසුකමට මුවාවෙලා Way of Registration පැත්තකට දාලා ඉන්දියානු සමාගම්වලින් ඖෂධ මිලදී ගැනීමට සෞඛ්‍ය අමාත්‍යාංශය යොමු වුණා. ජාතික ඖෂධ නියාමන අධිකාරියේ ප්‍රධාන විධායකගේ අත්සනින් පමණක් ඉන්දියන් ණය පහසුකමෙන් ඉන්දියානු ඖෂධ මිලදී ගැනීමට අවස්ථාවක් හදා දුන්නා. එසේ ගෙනෙන ලද ඖෂධවල බරපතළ ප්‍රශ්න තිබෙනවා. ඒ නිසාම තමයි, ඇස් අන්ධවීම්, බෙහෙත් නිසා මියයෑම් සිදුවුණේ එවැනි ඖෂධ හේතුවෙන්. ඇමතිවරයාගේ අනුමැතියකින් තොරව ඩොලර් බිලියන තුනකට ආසන්න ගනුදෙනුවක් කිසිසේත් සිදුකළ නොහැකියි.

සැපයීම් අංශයේ සිටින සමහර නිලධාරීන් සහ සෞඛ්‍ය අමාත්‍යාංශයේ ලේකම්වරයා අත්අඩංගුවට ගෙන තිබෙනවා. නමුත් ඒ අවස්ථාවේ විෂය භාරව සිටි අමාත්‍ය කෙහෙලිය රඹුක්වැල්ල වෙනුවෙන් නීතිය ක්‍රියාත්මක වෙන්නේ නැහැ."

# අද තිබෙන්නේ දරුවන්ට පවා එපා වී තිබෙන ආණ්ඩුවක්



ජාතික ජන බලවේගයේ ජාතික විධායක සභික සමන්මලී ගුණසිංහ සහෝදරිය

සුරාසල් විවෘත කර තබන කාලය දීර්ඝ කර ආණ්ඩුව තාත්තලාට බොන්න දෙන බවත් අම්මලා පිටරට යවන බවත් පෙන්වා දුන් ජාතික ජන බලවේගයේ ජාතික විධායක සභික සමන්මලී ගුණසිංහ සහෝදරිය, මේ තත්වය තුළ අනාරක්ෂිත කර ඇති දරුවන් සම්බන්ධ අපරාධ ඉහළ යමින් පවතින බවත් මේ වන විට පවතින්නේ දරුවන්ට පවා එපා වුණු ආණ්ඩුවක් යැයි ප්‍රකාශ කළාය.

සමන්මලී ගුණසිංහ සහෝදරිය මේ අදහස් පළ කළේ පසුගිය 03වැනි දින ජ.වි.පෙ. ප්‍රධාන කාර්යාලයේ පැවති ජාතික බලවේගයේ කාන්තාවෝ සංවිධානයේ මාධ්‍ය හමුවකට එක්වෙමිනි.

මෙහිදී තවදුරටත් අදහස් පළ කළ සමන්මලී ගුණසිංහ සහෝදරිය මෙසේද පැවසුවාය.

"දෙදහස් විසිහතර අයවැයෙන් යම් හෝ සහනයක් ලැබේවි කියලා මුළු රටක් බලාගෙන සිටියා. නමුත්, හැමදාමත් වගේ ඒ බලාපොරොත්තුව සිහිනයක්ම පමණයි. අයි.එම්.එෆ්. සමග එකතු වී සකස් කළ ආර්ථික න්‍යාය පත්‍රය ලබන වසරටත් හොඳටෝම ගළප්පාගෙන තිබෙනවා. අද අසීමිතව පීඩාවට පත් වී සිටින ජනතාව තවදුරටත් සමතලා කරගෙන යන්න බදු පටවන අයවැයක් ඉදිරිපත් කර තිබෙන්නේ. ඒ අතර ළමා හා කාන්තා කටයුතු අමාත්‍යාංශයෙන් විශාල මුදලක් කප්පාදු කර තිබෙනවා. ගැබිණි මවුවරුන්ට, කිරි දෙන මවුවරුන්ට, දරුවන්ට පෝෂණ ඌණතා තිබියෙදී, තත්වය වඩාත් දරුණු වෙමින් තිබියෙදී, දෙදහස් විසිතුනට වෙන් කර තිබූ රුපියල් බිලියන 152 දෙදහස් විසිහතරේදී රුපියල් බිලියන 77 දක්වා කපාහැර තිබෙනවා. මේ කපාහැරීම නිසා විශේෂ අවශ්‍යතා ඇති පිරිස අතුරින් ළමයින් සහ කාන්තාවන් කෙරෙහි බරපතළ පීඩනයක් ඇති කරනවා. ඒ නිසා අද ඉතිරි වී තිබෙන්නේ ආණ්ඩුව පලවාහැරීමෙන් උත්තර සොයා ගන්න විතරයි."


බත්තරමුල්ල, පැලවත්ත, පන්නිපිටිය පාරේ 464/20 හි පදිංචි එම්.ටිල්වින් සිල්වා වන මා විසින් අංක 43/20, නුගගහ පෙදෙස, පිළියන්දල පාර, මහරගම පිහිටි නියමුවා ප්‍රකාශන ආයතනයේ මුද්‍රණය කරවා ප්‍රසිද්ධ කරන ලදී.